# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,133 - 2019 ජූලි මස 19 වැනි සිකුරාදා - 2019.07.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

## තනතුරු ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මකවන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර 03 කට නොඅඩු නීතිඥයකු වශයෙන් සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබා ගත් කාලය, දිනය හා නිලමුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.)

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු පහත දක්වෙන කාර්යයන්වලට අදළ පළපුරුද්ද ලබා තිබීම.

i. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම,
ii. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු,
iii. අදළ ණයපනත් සම්බන්ධව නෛතික කටයුතු,
iv. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු,
v. විවිධ ආයතනවලින් පවත්වනු ලබන නීති කටයුතුවලට අදාළ පරීක්ෂණ සම්බන්ධ කටයුතු.

(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කල සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමෙන් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

(iv) වෙනත් සුදුසුකම්

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය,
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය,
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසිඃ*

(i) මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත්විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට පත් වී වසර 03 ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

04. වයස් සීමාව

ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට, වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

05. වැටුප් පරිමාණය
මෙම තනතුරට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 (SL-1-2016) මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | **25** |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය | 25 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) | 20 | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 05 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 05 | |
| | සටහන : ගෞරව සාමාර්ථයක් සමඟ අවසන් විභාගය සමත්වුවහොත් පමණක් ලකුණු 05 ලබාදිය යුතුයි.<br>(උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දේ) | | |
| 02 | *අතිරේක වෘත්තීය පළපුරුද්ද* : | | **35** |
| | i. අතිරේක වෘත්තීය සුදුසුකම් | 10 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට වැඩි ඩිප්ලෝමාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 10 කි) | | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |
| | රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට වැඩි හා මාස 06 කට අඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක්පාඨමාලාවකට ලකුණු 03 බැගින්) | | |
| | **(අංක 01 යටතේ වන ලකුණු ලබා දුන් සහතික හැර වෙනත්)** | | |
| | ii. *අතිරේක පළපුරුද්ද* : | 25 | |
| | නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද<br>(එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 25ක්)<br>(මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02) | | |
| | (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 03 ක සේවා කාලය හැර)<br>(අවුරුදු 20 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මඟින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.)<br>(ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරින් හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් සඳහා ආයතන ප්‍රධානී විසින් අතිරේක පළපුරුද්ද සනාථ කිරීමේදී අයදුම්කරු නීතිමය තනතුරක සේවය කරන බවට සේවා සහතිකයක්/සහතික පත් මඟින් සනාථ කළ යුතුය) | | |
| 03 | *තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම* | | **10** |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදරා තිබීම සඳහා | 10 | |
| | රජයේ පිළිගත් ආතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 07 | |
| | රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06/පැය 720 | 05 | |
| | - මාස 03/පැය 360 | 03 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | | |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අගෝස්තු මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූලි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

| | විෂයය | | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04 | *භාෂා ප්‍රවීණතාව* | | 15 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය/නීතිවේදී උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය.) | 15 | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500) | 10 | |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 06 /පැය 720 | 07 | |
| | - මාස 03/පැය 360 | 05 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | | |
| 05. | *සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව :* | | 15 |
| | i. සාමාන්‍ය දැනීම හා බුද්ධිය | 05 | |
| | ii. නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම | 05 | |
| | iii. පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | 05 | |
| | මුළු එකතුව | | 100 |

07. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය**

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
- සම්මුඛ පරීක්ෂණයේදී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. **අයදුම්පත් ඉදිරිපත් කිරීම**

i. අයදුම්පත් 2019.08.05 දිනට හෝ එදිනට ප්‍රථම ලේකම්, බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය, අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1 සිට 4 දක්වාත් 02 වන පිටුව අංක 5 සිට 9 දක්වාත් ඉතිරිය 03 වන පිටුවටත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළයුතුය.

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම්පස කෙලවරේ ''නීති නිලධාරී තනතුර සඳහා අයදුම්කිරීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු.47,615 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

vi. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

09. **සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඒ. පී. ජී. කිත්සිරි,
ලේකම්,
බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය.

2019 ජූලි මස 01 වැනි දින.
අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයදුම් පත්‍රය**

බුද්ධ ශාසන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - 2019

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අදල අංකය කොටුව තුල ලියන්න. සිංහල 2/දෙමළ -3)

(1) i. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : GUNAWARDHANA, M. G. B. S. K.

ii. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

iii. මුලකුරු සමඟ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

iv. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්/දෙමළෙන්)

(2) සම්පූර්ණ ලිපිනය :
i. ස්ථිර පදිංචි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
ii. ස්ථිර පදිංචි ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
iii. සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
iv. දුරකථන අංකය :————.

(3) ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0 ☐ (ආදාළ කොටුව තුල ලියන්න)

(4) විවාහක/අවිවාහක බව : විවාහක - 1, අවිවාහක -2 ☐ (අදාළ කොටුව තුල ලියන්න)

(5) i. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

ii. අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

(6) ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(7) සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබා ගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තරය :

| *සුදුසුකම* | *ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය* |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ |

(8) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :

(9) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදළ විස්තර :

| *සුදුසුකම* | *ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය/කාල සීමාව* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | |
| i. ............................ | ............................ | ............................ |
| ii. ............................ | ............................ | ............................ |
| iii. ............................ | ............................ | ............................ |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | | |
| i. ............................ | ............................ | ............................ |
| ii. ............................ | ............................ | ............................ |
| iii. ............................ | ............................ | ............................ |
| 3. අතිරේක පළපුරුද්ද | | |
| i. ............................ | ............................ | ............................ |
| ii. ............................ | ............................ | ............................ |
| iii. ............................ | ............................ | ............................ |
| 4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව | | |
| i. ............................ | ............................ | ............................ |
| ii. ............................ | ............................ | ............................ |
| iii. ............................ | ............................ | ............................ |
| 5. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම : | | |
| i. ............................ | ............................ | ............................ |
| ii. ............................ | ............................ | ............................ |
| iii. ............................ | ............................ | ............................ |

(10) අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, තොරතුරු බව සහතික කරන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන සියලු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(11) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

ඉහත නම සඳහන් ............................................ මහතා/මහත්මිය/මෙනෙවිය මා දන්නා හඳුනන බවත්, අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව

නම :————.
තනතුර :————.
දිනය :————.

(12) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් ............................................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

07-627

## විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අයත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ (MN 3-2016) කාර්මික නිලධාරි (යාන්ත්‍රික) තනතුරු 05ක් සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉල්ලුම් පත්‍රය, මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව ඒ4 කඩදසියේ (21cm x 29cm) දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අපේක්ෂකයා විසින් තම අත් අකුරින් ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍ර 2019.08.02 දින හෝ ඊට පෙර ලැබෙන සේ ''ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, තැ.පෙ. 537, කොළඹ 07'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි'' ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරි (යාන්ත්‍රික), III ශ්‍රේණියට බඳවා ගැනීම - 2019'' ලෙස සඳහන් කළ යුතුය. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කල යුතු අතර, ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයා/අපේක්ෂිකාව තමා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

(1) රැකියා විස්තරය :

1.1 යාන්ත්‍රික ඒකකයට අයත් යන්ත්‍රෝපකරණ/වාහන පිළිබඳව භාරව සිටීම සහ ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව පරීක්ෂා කිරීම.

1.2 යන්ත්‍ර/වාහන අලුත්වැඩියාව සහ නිසි පරිදි නඩත්තු කිරීම සම්බන්ධව කටයුතු හා ඊට අදළ ලිපි ලේඛන පවත්වාගෙන යාම

1.3 එක් එක් කර්මාන්ත හා වැඩබිම්වලට ගැලපෙන යන්ත්‍ර හා වාහන තෝරා දීම.

1.4 යාන්ත්‍රික ඒකකයේ යාන්ත්‍රික කාර්යය මණ්ඩලය භාර නිලධාරි ලෙස කටයුතු කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා උපදෙස් ලබා දීම.

(2) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

2.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් වේ. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

2.2 තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලටද රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන අංක 1589/30 දරන 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද දෙපාර්තමේන්තු නියෝගවලටද කලින් කලට රජය විසින්ම නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද යටත් විය යුතුය.

(3) සාමාන්‍ය සුදුසුකම් :

3.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

3.2 විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

3.3 බඳවා ගන්නා නිලධාරින් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට කැමති විය යුතුය.

3.4 අයුදුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.

3.5 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(4) අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව,භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම.

(5) වෘත්තීය සුදුසුකම් :

ඉහත 4හි අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ක්ෂේත්‍රයට අදළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට අදල සහතිකය ලබා තිබීම.

(i) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික)

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (යාන්ත්‍රික)

හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික)

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික)

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

(vi) රැකියා ක්ෂේත්‍රයට අදළව ජාතික වෘත්තීය කුසලතා ( NVQ ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

6. රැකියා ක්ෂේත්‍රයට තෝරා ගැනීමේ පදනම :

6.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි :
අයදුම්කරුවන් ලිඛිත විභාගයකට යොමු කරන අතර, පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය. එම විභාගයේ දී විෂයන් දෙක සඳහාම ලබා ගත් මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ.

6.2 ලිඛිත තරග විභාගයට අදළ විෂය නිර්දේශය :
විභාගය ප්‍රධාන වශයෙන් ප්‍රශ්න පත්‍ර 2කින් සමන්විතවේ.

1. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 1 -මුළු ලකුණු 100
2. පොදු පරීක්ෂණය - කාලය පැය 1 -මුළු ලකුණු 100
(තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්‍ෂණය)

විෂය නිර්දේශය

01. බුද්ධි පරීක්ෂණය
අපේක්‍ෂක, අපේක්ෂිකාවන්ගේ භාෂා හැකියාව හා අවබෝධය, සංඛ්‍යාමය, හැකියාවන්, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ මාදිලියේ, කෙටි පිළිතුරු මාදිලියේ වැනි වාස්තවික ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

02. පොදු පරීක්ෂණය

1. මෝටර් යාන්ත්‍රික විද්‍යාව

(i) ස්නේහනයේ වැදගත්කම, ස්නේහය ක්‍රම හා ඒවායේ දෝෂ තීරණය කිරීම.
(ii) ස්නේහන වර්ග හා ඒවා යෙදීම් සඳහා භාවිතා කරන උපකරණ ටයර් ටියුබ් හඳුනා ගැනීම.
(iii) ටයර් ටියුබ්වල සේවාවන් කිරීම
(iv) මෝටර් වාහනවල එන්ජින් කොටස්, ක්ලච්, පද්ධතිය, බල සම්ප්‍රේෂණ පද්ධතිය හා වාහනයේ විවිධ කොටස්වල ක්‍රියාකාරීත්වය හා දෝෂ නිර්ණය කිරීම හා අලුත්වැඩියාවන්.
(v) වාහන බොඩි කොටස්වල තහඩු වැඩ හා පින්තාරු කිරීම.

2. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණවල :
(i) ද්‍රාවබල පද්ධති පවත්වා ගැනීම, නඩත්තු හා අලුත්වැඩියාවන්,
(ii) විදුලි/ඉලෙක්ට්‍රොනික/පරිගණක පද්ධති පවත්වාගෙන යාම, නඩත්තු හා අලුත්වැඩියාවන්.
(iii) යන්ත්‍රවල අන්ඩර්කැරේජ් හා ක්‍රියාකරණ කොටස්වල තත්ත්වය පවත්වාගෙන යාම, නඩත්තු හා අලුත්වැඩියාවන්

3. යන්ත්‍රාගාර :
(i) යාන්ත්‍රික ඒකකවල ඇති විවිධ වර්ගවල යන්ත්‍ර හඳුනා ගැනීම.
(ii) යාන්ත්‍රික ඒකකවල ඇති විවිධ වර්ගවල යන්ත්‍රවල නිවැරදි ක්‍රියාකාරිත්වය හා නඩත්තුව

4. ද්‍රව්‍යවල ගුණ හා සරල ගණනය කිරීම් :
(i) විවිධ ද්‍රව්‍යයන් හඳුනා ගැනීම.
(ii) ද්‍රව්‍ය මත බල ක්‍රියා කිරීමේදී හැසිරීම, පරිමාව, බලය, බලඝූර්ණය, කාර්යය, කාර්යක්ෂමතාව වැනි සරල ගණනය කිරීම්.

5. ආරක්ෂිත ක්‍රම :
(i) යාන්ත්‍රික ඒකකවල/යන්ත්‍රෝපකරණවල තිබිය යුතු ආරක්ෂිත ක්‍රම.

6. ඉගැන්වීමේ ක්‍රම :
ඉහත සඳහන් යාන්ත්‍රික ඒකකයක යන්ත්‍රවල නිවැරදි භාවිතය, දෝෂ නිර්ණය කිරීම සහ නඩත්තුව පිළිබඳව සිද්ධාන්තික හා ප්‍රායෝගික පන්ති පැවැත්වීමේදී අනුගමනය කරන ඉගැන්වීම් ක්‍රම හා ඉගැන්වීමේ ආධාරක පිළියෙල කිරීම, නවීන ඉගැන්වීමේ ආධාරක පිළිබඳ අවබෝධය

6.3 විභාගයේ භාෂා මාධ්‍යය :
විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පිළිතුරු දිය යුතුය.

7. බඳවා ගැනීම :
ඉහත 4 හා 5 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති තෝරාගත් අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (යාන්ත්‍රික) iii ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

8. වැටුප් පරිමාණය (මාසික) :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන i යටතේ MN3-2016 වැටුප් පරිමාණය අනුව

රු. 31,040-10x445-11x660-10x730-10x750-57,550/-
(උපලේඛන i හි සඳහන් නව වැටුප් පරිමාණයන් හිමිවන්නේ 2020.01.01. දින සිට වන අතර, එතෙක් උපලේඛන ii හි සඳහන් පරිදි වැටුප් ගෙවීමට කටයුතු කරනු ඇත.)

9. ශ්‍රේණි උසස් කිරීම :
අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලවය.

10. විභාග ගාස්තු :
අයදුම්කරුවන් විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු. 1000 ක මුදලක් ඕනෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකට ගෙවිය හැකි අතර, ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් මුදල් භාරගත් බවට ගො.සේ.ම./2 (අ) කුවිතාන්සිය අයදුම්කරුට ලබා දෙනු ඇත. එම කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම සුදුසුය. කුමන හේතුවක් නිසා හෝ එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

11. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අනතුරට බැඳී වසර 05ක් ඇතුලත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

12. අත්සන සහතික කිරීම :
අයදුම්පතෙහි අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සමාදන විනිශ්චයකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු රාජ්‍ය සේවයේ ස්ථිර, මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතුය.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

2019 ජුනි මස 20 වැනි දින,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ.පෙ.537,
කොළඹ 07

(කාර්යාලීය ප්‍රයෝජන සඳහා පමණි.)

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව*

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරි (යාන්ත්‍රික) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019**

ලිඛිත තරග විභාගයට පෙනී සිටින මාධ්‍යය :
සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

(අදල ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න)

1. (i) මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA A. B.
(ii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. (i) ස්ථිර ලිපිනය :————.
(ii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(iii) අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
(iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

3. ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0

ස්ත්‍රී - 1 (අදළ අංකය කොටුව තුළ ලියන්න.)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. (i) උපන් දිනය :

වර්ෂය මාසය දිනය

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

6. දුරකථන අංකය :

7. විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1
විවාහක - 2 (අදළ අංකය කොටුව තුළ ලියන්න.)

8. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.)

(i) විභාගය සමත් වූ වර්ෂය හා මාසය :————.
(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ...................... | ...................... | ...................... | ...................... |
| ...................... | ...................... | ...................... | ...................... |
| ...................... | ...................... | ...................... | ...................... |
| ...................... | ...................... | ...................... | ...................... |
| ...................... | ...................... | ...................... | ...................... |

9. අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න)
(i) විභාගය සමත්වූ වර්ෂය හා මාසය :————.
(ii) අයදුම්කරුගේ විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| ...................... | ...................... |
| ...................... | ...................... |
| ...................... | ...................... |
| ...................... | ...................... |

10. අනෙකුත් සුදුසුකම් : තාක්ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න)

| *ආයතනය* | *හදරා ඇති පාඨමාලාව* | *කාලය* | *සාමාර්ථය* |
| --- | --- | --- | --- |
| | | | |

11. අදළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද :
..........................................................................
..........................................................................

12. (i) ගොවිජන සේවා මධ්‍යස්ථානයට මුදල් ගෙවූ කුවිතාන්සි අංකය හා දිනය :————.
(ii) ගොවිජන සේවා මධ්‍යස්ථානය :————.
දිස්ත්‍රික්කය :————.

> කුවිතාන්සි මුල් පිටපත මෙම කොටුවෙහි නොගැලවෙන සේ ඇලවිය යුතුය.
> (කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ සතුව තබා ගැනීම ඉදිරි විමසීම්වලදී ප්‍රයෝජනවත් වනු ඇත.)

13. අයදුම්කරුගේ ප්‍රකාශය :
මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමටත් හැකි බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අත්සන සහතික කිරීම :
මෙහි අත්සන් කරන ලද .......................................... හි පදිංචි .......................................... මයා/මිය/මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහුගේ/ඇයගේ අත්සන ................ දින මා ඉදිරිපිට දී තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

15. *රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි.*

මෙම ඉල්ලුම්කරු වන ............................ මහතා/මහත්මිය/මෙනවිය දනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ............................වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව.)

07-634

---

**රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2019)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 නොවැම්බර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

1. මෙම නිවේදනයේ ''ලේකම්'' යනුවෙන් අදහස් කරනුයේ ''රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්'' වේ. ''සේවය'' යන පදයෙන්අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂීකොට සඳහන් කර නොමැති අවස්ථාවන්හි දී ''ශ්‍රී ලංකා පරිපාලන සේවය'' වේ.

2. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2019 අගෝස්තු මස 19 වන දින වේ.

*සටහන :* අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

ලිඛිත විභාගය : මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර පහ (05) කින් සමන්විත වේ.

I. සාමාන්‍ය බුද්ධිය;
II. ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා;
III. ගෝලීය ප්‍රවණතා;
IV. කළමනාකරණමය අභියෝගතාව;
V. නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා

*සම්මුඛ පරීක්ෂණය.*-ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

3. පත් කරනු ලබන සංඛ්‍යාව 203 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂක-යන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

4. *සේවා කොන්දේසි :*

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුවේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5. *මාසික වැටුප් පරිමාණය :*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 47,615- 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛනයේ II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිවේ.

6. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම,
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම,
(iii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

*සටහන :* මූලික උපාධියක් හෝ පශ්චාත් උපාධියක් ලබා ඇති අයදුම්කරුවන්ට අයදුම්කළ හැකි වේ. උපාධිය බලපවත්නා දිනය සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනට හෝ එදිනට පෙර දිනයක් විය යුතුය. බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම ලෙස සලකා බලනු ලබන පශ්චාත් උපාධි සුදුසුකම උසස්වීම සඳහා ආදේශ කර ගනු නොලැබේ.

(ඇ) වයස :
අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු විසිදෙකට (22) ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිහට (30) ට නොවැඩි විය යුතු ය. ඒ අනුව 1997.08.19 දිනට හෝ ඊට පෙර හා 1989.08.19 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

(ඈ) සුදුසුකම් පිළිබඳ සීමාවන් :
(i) විවෘත තරග විභාගය සඳහා වාර දෙක (02) කට වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත. (2013.12.23 දින පූර්වයෙන් වූ සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය සඳහා පෙනී සිටි වාර ගණන අදළ කර ගනු නොලැබේ.)
(ii) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
(iii) කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

7. *විභාග ගාස්තු* :- විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,200 කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පළමුව දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 20-03-02-13ට බැර කිරීම සඳහා ගෙවිය යුතු ය. මුදල් ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ අදළ කොටුවෙහි ඇලවිය යුතු ය. මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

8. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (ඒ4) ප්‍රමාණයේ කඩදසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. 1.0 සිට 2.12 තෙක් වන ශීර්ෂ අයදුම්පත් කඩදසියේ පළමුවැනි පිටුවේද, 3.0 සිට 7.0 තෙක් එහි දෙවන පිටුවේද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක.

(ආ) අයදුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන්ම විය යුතු ය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2019 අගෝස්තු මස 19 වන දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව ''ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018 (2019)'' යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාරගනු නොලැබේ. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ඈ) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පති-වරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥ-වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දන්වීමේදී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට ඉල්ලීම් ලිපියක්, දන්වීමේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදයි වනු ඇත. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදනමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9. විභාගයට ඇතුළුවීම :-

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදල ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන.*-අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :-
තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහ-මකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.
(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාග යට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දන දනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :
(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(ආ) විභාගයට පෙනී සිටින ලද මාධ්‍යය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

*සටහන* :-
(i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
(ii) තම අයදුම්පත්‍රයෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

14. *බඳවා ගැනීමේ ක්‍රමය* :

14.1 ලිඛිත විභාගය

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර පහ (05) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදිවේ.

| | *විෂයය* | *ලකුණු ප්‍රමාණය* | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය |
| --- | --- | --- | --- |
| 1 | සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2 | ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා | 100 | 50 |
| 3 | ගෝලීය ප්‍රවණතා | 100 | 50 |
| 4 | කළමනාකරණමය අභියෝගතාව | 100 | 50 |
| 5 | නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා | 100 | 50 |

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

14.2. සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

(i) සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්තවේ.

(*අ*) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

(*ආ*) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ, මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාව, නායකත්ව ගුණාංග සහ සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25) කි.

| | *විෂය ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01 | කළමනාකරණ කුසලතාව | 10 |
| 02 | නායකත්ව ගුණාංග | 05 |
| 03 | සන්නිවේදන කුසලතා | 05 |
| 04 | පෞරුෂය | 05 |
| | එකතුව | 25 |

(ii) එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව සහ අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව පමණි.

(iii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබාදෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

(iv) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙලින් සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

සැලකිය යුතුයි :-
සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results, exams.gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

15. ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :-

(01) සාමාන්‍ය බුද්ධිය :

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළැඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 1 යි. ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය වරණ 4ක් සහිත බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ප්‍රවණතා :

ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්වයන් හා අදාළව නිර්මාණාත්මකව විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 2යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය වරණ 4ක් සහිත බහුවරණ ප්‍රශ්න සහ ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(03) ගෝලීය ප්‍රවණතා :

ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 2යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය වරණ 4ක් සහිත බහුවරණ ප්‍රශ්න සහ ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(04) කළමනාකරණමය අභියෝගතාව :

ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනා දී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 2යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය වරණ 4ක් සහිත බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත රචනා ප්‍රශ්න ප්‍රශ්නවලින් සමන්විත වේ.)

(05) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා :

දෙන ලද මාතෘකාවන්/ තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන්/ තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය රචනා/අර්ධ ව්‍යුහගත රචනා ස්වරූපයේ ප්‍රශ්න වලින් සමන්විත වේ.)

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන ආපදා කළමනාකරණ සහ
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

2019 ජූලි මස 05 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018 (2019)**
Open Competitive Examination for Recruitment to Grade III of
Sri Lanka Administrative Service - 2018 (2019)

1.0

1.1 මාධ්‍යය :-

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.2 විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය :-

කොළඹ නගරය - 01
කෝට්ටේ - 02
රාජගිරිය - 03
නුගේගොඩ - 04
මහරගම - 05
හෝමාගම - 06
අවිස්සාවේල්ල - 07
දෙහිවල - 08
මොරටුව - 09
පිළියන්දල - 10
කඩුවෙල - 11

| නගරය | නගර අංකය |
|---|---|
| | |

(අදාළ නගරය හා නගර අංකය කොටුව තුළ ලියන්න. නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ————— .
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම : ————— .
(උදා: GUNAWARDHANA, H.M.S.K.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ————— .

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) : ————— .

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ————— .

2.6 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

2.7 විවාහක/ අවිවාහක බව : අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

2.8 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.9 ජාතික හැඳුනුම්පත් අංකය :

2.10 උපන් දිනය : වර්ෂය: මාසය : දිනය :

2.11 සුදුසුකම් සැපිරිය යුතු 2019.08.19
දිනට වයස :- අවුරුදු : මාස : දින :

2.12 දුරකථන අංකය :- ජංගම: ස්ථාවර :

3.0 (i) උපාධිය ලද දිනය : ————— .
(ii) විශ්ව විද්‍යාලය / ආයතනය : ————— .
(iii) ලියාපදිංචි අංකය : ————— .
(iv) බාහිර/ අභ්‍යන්තර : ————— .
(v) උපාධිය : ————— .
(vi) විෂයයන් : ————— .
(vii) පන්තිය : ————— .
ඉහළ/පහළ : ————— .
(viii) උපාධිය වලංගු දිනය : ————— .
(ix) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය : ————— .

4.0 ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වූ මීට පෙර පැවැත් වූ විභාගයන්ට පෙනී සිටි වර්ෂ සඳහන් කරන්න.

| | *විභාගය* | *පෙනී සිටි/නොසිටි බව* |
|---|---|---|
| 2013 දෙසැම්බර් මස 23 වැනි දින අංක 1842/2 අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව (දැනට ක්‍රියාත්මක) 2012.07.01 වැනි දිනට පසු පෙනී සිටි වර්ෂයන් | 2013 (2015) විවෘත | |
| | 2014 (2016) විවෘත | |
| | 2015 (2016) II අදියර විවෘත | |

5.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

ලදුපත නොගැලවෙන ලෙස එහි එක් දාරයකින් මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

6.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .............. හා ..................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

:

—————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

7.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට්* නිවේදනයේ 8 (ඈ) පරිදි විය යුතුය.) :-

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන................................................ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා, එම ලදුපත අලවා ඇති බවත්, .................. දින ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

—————,
(අත්සන)

දිනය :—————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

8.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය :- (රාජ්‍ය/පළාත් රාජ්‍ය/ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................ මහතා / මහත්මිය / මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ................................................ ලෙස සේවය කරන අතර, ඔහුගේ / ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ය.

—————,
(ආයතන ප්‍රධානියාගේ අත්සන)

දිනය :—————.
නම :—————.
තනතුර :—————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

## රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018 (2019)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 නොවැම්බර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

1. මෙම නිවේදනයේ :
   - (අ) ''ලේකම්'' යන පදයෙන් අදහස් කරනුයේ ''රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්'' වේ.
   - (ආ) ''සේවය'' යන පදයෙන් අදහස් කරනුයේ වෙනත් ආකාරයකින් සුවිශේෂී කොට සඳහන් කර නොමැති අවස්ථාවන් හිදී ''ශ්‍රී ලංකා පරිපාලන සේවය'' වේ.

02. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය සඳහා වේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2019.08.19 දින වේ.

ලිඛිත විභාගය - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්නපත්‍ර හතර (04) කින් සමන්විත වේ.

(i) සාමාන්‍ය බුද්ධිය
(ii) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා
(iii) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව)
(iv) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව).

***සම්මුඛ පරීක්ෂණය*** :-ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුලු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණ පැවැත්වෙන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලේකම් විසින් තීරණය කරනු ඇත.

03. පත් කරනු ලබන සංඛ්‍යාව 54 කි. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 80 වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ. පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

04. සේවා කොන්දේසි :

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1842/2 සහ 2013.12.23 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු, /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතු ය.

4.5 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසිකරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5. මාසික වැටුප් පරිමාණය :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 47,615/- 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 110,895 (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛනයේ 11 හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිළධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

6. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ)
i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

(ආ) *අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද* :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම.

සහ

රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි වැටුප් කේත අංක එම්. එන්. 2-2016 හෝ ඊට ඉහළ එම්. එන්. වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ එස්. එල් 1-2016 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

හෝ

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක හෝ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි වැටුප් කේත අංක එම් එන් 2-2016 හෝ ඊට ඉහල එම්. එන්. වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ එස්. එල් 1-2016 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක, අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියකු වීම.

සටහන :

1. මූලික උපාධියක් හෝ පශ්චාත් උපාධියක් ලබා ඇති අයදුම්කරුවන්ට අයදුම්කළ හැකි වේ. බඳවා ගැනීම සඳහා මූලික සුදුසුම ලෙස සලකා බලනු ලබන පශ්චාත් උපාධි සුදුසුකම උසස්වීම් සඳහා ආදේශ කර ගනු නොලැබේ.
2. උපාධිය බලපවත්නා දිනය 2018.07.01 වැනි දින හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.
3. ඉහත සඳහන් කාලය ගණනය කිරීමේ දී රාජ්‍ය සේවය සහ/හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි අදළ අඛණ්ඩ සේවා කාලයන්හි එකතුව ගණන් ගනු ලැබේ.

(ඇ) වයස සහ සපුරා තිබිය යුතු වෙනත් සුදුසුකම් :

(i) 2018.07.01 වැනි දිනට වයස් සීමාව අවුරුදු පනස් තුන (53)ට නොවැඩි විය යුතු ය. ඒ අනුව 1965.07.01 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

(ii) ඉහත 6(ආ) හි සඳහන් සේවයක/තනතුරක ස්ථිරත්වය ලබා තිබීම,

*සටහන* : මේ වන විට අදළ පත්වීම් බලධරයා විසින් සේවය ස්ථිර කිරීමට අදළ ලිපිය නිකුත් කර නොමැති නමුත් විභාග නිවේදනයේ 06. ඡේදය අනුව විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති සහ අදළ සේවා ව්‍යවස්ථාව/බඳවා ගැනීම් පටිපාටිය අනුව සේවයේ ස්ථිර කිරීමට අදළ සියලු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම්කළ හැකිය.

එහෙත් එම නිලධාරින්,

(1) සේවයේ ස්ථිර කිරීමට අදළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට සමත්ව තිබිය යුතුය.
(2) එම නිලධාරින් මෙම විභාගය සමත්ව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි නම් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වන අවස්ථාව වන විට සේවයේ ස්ථිර කිරීමේ ලිපිය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. (ස්ථිර කිරීමේ දිනය සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට හෝ ඊට පෙර වන පරිදි බලාත්මක විය යුතුය.)

(iii) පූර්වාසන්න අවුරුදු 05 තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබීම.

(iv) පූර්වාසන්න අවුරුදු 05 තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.

(ඈ) *සුදුසුකම් පිළිබඳ සීමාවන්* :

(i) සීමිත තරග විභාගය සඳහා වාර දෙක (02) කට වඩා පෙනී සිටීමට කිසිදු අයදුම්කරුවකුට අවසර නොමැත.
(පෙර සේවා ව්‍යවස්ථා යටතේ අයදුම්කරුවන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාග සඳහා පෙනී සිටි වාර ගණන අදළ කරගනු නොලැබේ.)

(ii) මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2018.07.01 වැනි දිනට හෝ එදිනට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iii) කුමන හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

7. *විභාග ගාස්තු* :- විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,200 කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදයමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් /උප තැපැල් කාර්යාලයක් හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

8. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදසියේ දෙපැත්ත භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 4.0 (II) තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව පිරවිය යුතු අතර හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇතිඅයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු වේ. එසේ නොවුනහොත් එය ප්‍රතික්ෂේප විය හැක.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඇ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2019 අගෝස්තු මස 19 වැනි දිනට පෙර යැවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව ''ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018 (2019)'' යනුවෙන් ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාරගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

(ඈ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(ඊ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පුවත්පත්වල හා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හේ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම් ලිපියක්, එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීම වඩාත් ඵලදයි වනු ඇත. තව ද විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදනමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9. විභාගයට ඇතුළුවීම :-

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයෙකු ම නියමිත විභාග ශාලාවට අදල ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවාගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අපෙක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

*සටහන* :- අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-
තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :-

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(ආ) විභාගයට පෙනී සිටින ලද මාධ්‍යය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

*සටහන* :-
(i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
(ii) අයදුම්පත්‍රයෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.

14. බඳවා ගැනීමේ ක්‍රමය :-

14.1 ලිඛිත විභාගය :

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර හතර (04) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. විෂයයන් සහ එක් එක් විෂයය සමත්වීමට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| | විෂයය | ලකුණු ප්‍රමාණය | සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | සාමාන්‍ය බුද්ධිය | 100 | 50 |
| 2 | ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා | 100 | 50 |
| 3 | රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදළව) | 100 | 50 |
| 4 | රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව) | 100 | 50 |

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

14.2. සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ

(i) සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්ත වේ.

(අ) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*

(i) ඉහත අංක 06 හි සඳහන් බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

(ආ) *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතා, නායකත්ව ගුණාංග සන්නිවේදන කුසලතාවය සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු විසිපහ (25) කි.

| | විෂය ක්ෂේත්‍රය | උපරිම ලකුණු |
|---|---|---|
| 01 | කළමනාකරණ කුසලතා | 10 |
| 02 | නායකත්ව ගුණාංග | 05 |
| 03 | සන්නිවේදන කුසලතා | 05 |
| 04 | පෞරුෂත්වය | 05 |
| | එකතුව | 25 |

ii. එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට පනහ (50%) ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් සියලුම විෂයයන්ට ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව හා අපේක්ෂිත පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දක්වෙන සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් නොමැති වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව පමණි.

iii. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර එහිදී ලකුණු ලබාදෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද, එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

iv. පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් සේවයේ තුන්වන (III) ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

සැළකිය යුතුයි :-

සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

14.3 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම් දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www. results. exams. gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

15. ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :-

(01) සාමාන්‍ය බුද්ධිය

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළැඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 1 1/2 යි. ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුවේ.)

(02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ හා ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ ගෝලීය තත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මකව අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

(03) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I (ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදාළව).

රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් හෝ සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට අදාළ රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

(04) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II (නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා මැන බැලීම පිළිබඳව)

දෙන ලද මාතෘකාවන්/ තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන්/ තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(කාලය පැය 3යි - ලකුණු 100යි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.)

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

2019 ජූලි මස 05 වැනි දින,

---

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018 (2019)
Limited Competitive Examination for Recruitment to Grade III of
Sri Lanka Administrative Service - 2018 (2019)

1.0 මාධ්‍යය :-

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ———— .
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ———— .
(උදා: GUNAWARDHANA, H.M.S.K.)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ———— .

2.4 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) : ———— .

2.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ———— .

2.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ———— .

2.7 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

2.8 ජාතික හැඳුනුම්පත් අංකය :

2.9 දුරකථන අංකය : ජංගම ස්ථාවර

2.10 විවාහක/ අවිවාහක බව : අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

2.11 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.12 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.0 ඔබ 2018.07.01 දිනට වූ සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න. ———— .

4.0 (i) *ගැසට්* නිවේදනයේ 6 වන ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේ ද ?

*(අ)* 2018.07.01 දිනට වයස : ———— .

*(ආ)* අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :
*ගැසට්* නිවේදනයේ 06 (ආ) ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ 06 (ආ) i/(ආ) ii යන ඒවායින් කුමකින්ද යන්න.........................

උපාධිය ලද දිනය : ———— .
විශ්ව විද්‍යාලය/ආයතනය : ———— .
ලියාපදිංචි අංකය : ———— .
බාහිර/ අභ්‍යන්තර : ———— .
උපාධිය : ———— .
විෂයයන් : ———— .
පන්තිය : ———— .
ඉහළ/පහළ : ———— .
උපාධිය වලංගු දිනය : ———— .
විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය : ———— .

*(ඇ)* විභාග අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි (පන්තියක්, ශ්‍රේණියක් හෝ බණ්ඩයක් ඇත්නම්) සඳහන් කළ යුතු ය. : ————.

දැනට දරන තනතුර :————.
එම තනතුර අයත් වන්නේ රාජ්‍ය සේවයට ද පළාත් රාජ්‍ය සේවයට ද යන්න :———— .
ශ්‍රේණිය :————.
පන්තිය/බණ්ඩය :————.
තනතුරට පත්වූ දිනය :————.
එම තනතුරේ ස්ථිර කළ දිනය :————.
වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :————.
අයදුම්කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදාළ නම් එම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කළ යුතු ය.

| *සේවය/ශ්‍රේණිය නම* | *අදාළ රා. පරි. චක්‍රලේඛ පරිදි වැටුප් කේත අංකය උදා. :MN 2-2016 (A)* | *පත්වූ දිනය* |
|---|---|---|
| (1) ................................... | .................. | .................. |
| (2) ................................... | .................. | .................. |
| (3) ................................... | .................. | .................. |
| (4) ................................... | .................. | .................. |
| (5) ................................... | .................. | .................. |

(ii) *ගැසට්* නිවේදනයේ 6 වැනි ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සේවයේ නියුතු සේවාවේ/-ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2018.07.01 දිනට සක්‍රීය හා සතුටුදායක මුළු සේවා කාලය :———— .

5.0 ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වූ මීට පෙර පැවැත් වූ විභාගයන්ට පෙනී සිටි වර්ෂ සඳහන් කරන්න :——— .

| | විභාගය | පෙනී සිටි/නොසිටි බව |
|---|---|---|
| 2013 දෙසැම්බර් මස 23 වැනි දින අංක 1842/2 අතිවිශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව (දැනට ක්‍රියාත්මක) 2012.07.01 වැනි දිනට පසු පෙනී සිටි වර්ෂයන් | 2013 (2015) සීමිත | |
| | 2014 (2016) සීමිත | |
| | 2015 (2016) II අදියර සීමිත | |

6.0 මුදල් කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න.

ලදුපත (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි එක් දරයකින් මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගන්න.)

7.0 අයදුම්කරුගේ සහතිකය ඃ

2018.07.01 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයා ගෙන ඇති බවත්, *ගැසට්* නිවේදනයේ 06(ආ) ඡේදයට අනුව 2018.07.01 දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත් (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................... හා .................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට හා ගනු ලබන තීරණ වලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————— .

8.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................ මහතා / මහත්මිය / මෙනවිය රාජ්‍ය සේවය යටතේ වන/ ................... පළාත් සභාව යටතේ වන ................. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ................... තනතුරක සේවය කරන බවද, 2018.07.01 දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බවද, *ගැසට්* නිවේදනයේ 06 (ආ) ඡේදයට අනුව අවුරුදු .......... (පහක/දහයක) සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සහිත බවද, අදාළ *ගැසට්* නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බවද, මෙයින් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :————— .
පදවි නාමය :————— .
දිනය :————— .
(නිලමුද්‍රාව යොදන්න.)

07-717

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

## බඩුබාහිරාදිය විකිණීම්

### දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පැල්මඩුල්ල

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පැල්මඩුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2019.08.10 වැනි දින පෙ.ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් කිසියම් ද්‍රව්‍යක් පිළිබඳ හිමිකම් පාන්නෙක් වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත අදළ භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක අදළ භාණ්ඩය වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

05. මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාර නොගැනේ.

07. ගැනුම්කරුවන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ඒ. එන්. ආර්. පෙරේරා,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
පැල්මඩුල්ල.

2019 ජුනි මස 25 වැනි දින,
පැල්මඩුල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 84924 | උදළු 01යි, පොඩි වේවැල් කුඩ 01යි |
| 02. | 84609 | සවල් 01යි |
| 03. | 84558 | ඉල්ලංකුරු 01යි, වේවැල් කුඩ 01යි, උදළු 01යි |
| 04. | 78617 | වේවැල් කුඩ 01යි, උදළු 01යි |
| 05. | 79246 | උදළු 02යි. වේවැල් කුඩ 01යි |
| 06. | 81799 | ඇළුමිනියම් මුට්ටි 01යි |
| 07. | 83320 | ඉල්ලංකුරු 02යි, අලවංගු 01යි, වේවැල් කුඩ 01යි |
| 08. | 83661 | උදළු 01යි |
| 09. | 85070 | වේවැල් කුඩ 01යි |
| 10. | 85081 | ඇදුම් උදළු 01යි |
| 11. | 83452 | ඇලුමිනියම් මුට්ටි 01යි |
| 12. | 85080 | උදළු 01යි |
| 13. | 85068 | අලවංගු 01යි |
| 14. | 85069 | වේවැල් කුඩ 01යි |
| 15. | 84940 | ඇලුමිනියම් මුට්ටි 03යි |
| 16. | 83614 | කුඩා ගෑස් සිලින්ඩර් 01යි, ලොකු ගෑස් සිලින්ඩර් 01යි |
| 17. | 83492 | වයර් එකක් සම්බන්ධ කරන ලද ජබොස් යන්ත්‍ර 01යි, උදළු 01යි, වේවැල් කුඩ 01යි, ඉල්ලංකුරු 01යි |
| 18. | 83727 | වයර් සම්බන්ධ කරන ලද ජබොස් යන්ත්‍ර 01යි, ඉල්ලං කවර 11යි |
| 19. | 63234 | අංක 135 -3621 යතුරු පැදිය (කැබලි කර විකිණීම සඳහා) |
| 20. | බී 540/16 | අංක NWJN 8809 දරන යතුරු පැදිය (කැබලි කර විකිණීම සඳහා) |
| 21. | බී. 180/16 | අංක SGBDC 9854 දරන යතුරු පැදිය (කැබලි කර විකිණීම සඳහා) |
| 22. | 71886 | අංක 20050627 දරන සී පැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය (කැබලි කර විකිණීම සඳහා) |

07-647

### අනුරාධපුර පොලිස් කොට්ඨාසය

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ වෙන්දේසිය

අනුරාධපුර පොලිස් කොට්ඨාසයේ පොලිස් කාර්යාලවල සහ පොලිස් ස්ථානවල භාවිතා කර පාවිච්චියෙන් ඉවත් කරන ලද පාවිච්චියට ගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2019 අගෝස්තු මස 06 වැනි දින පැය 0900 ට මිහින්තලය පොලිස් ස්ථාන පරිශ්‍රයේ දී පැවැත්වේ.

අදාළ භාණ්ඩ පරීක්ෂා කිරීම 2019.08.05 වැනි දින පැය 1500 සිට පැය 1600 දක්වා සිදු කළ හැක.

වෙන්දේසි භූමිය ඇතුළුවන සියලුම තරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

වෙන්දේසියට භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඇවර කිරීම, වෙන්දේසියෙන් භාණ්ඩ ඉවත් කිරීම සහ අනෙකුත් සියලුම තීරණ වෙන්දේසි මණ්ඩලය සතු වේ. වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

මිල දී ගනු ලබන සෑම භාණ්ඩයක් සඳහා ම එවලේ ම මුදල් ගෙවා ලදු පතක් ලබා ගත යුතු ය. චෙක්පත් හෝ වෙනත් ගෙවීම් ක්‍රම අනුමත නොකෙරේ.

මිල දී ගනු ලබන සියලුම භාණ්ඩ 2019 අගෝස්තු මස 06 වැනි දින පැය 1630 ට පෙර අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතු යි. එසේ ඉවත් කර නොගන්නා කිසිදු භාණ්ඩයක් පිළිබඳව වග කියනු නොලැබේ.

තිලිණහේවා පතිරණ,
කොට්ඨාස භාර පොලිස් අධිකාරි,
අනුරාධපුර.

*උපලේඛනය*

| *අනු. අංකය* | *භාණ්ඩ වර්ගය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | අධිශීතකරණ | 04 |
| 02. | අත් කියත් | 02 |
| 03. | ඇලුමිනියම් ජොග්ගු | 05 |
| 04. | ඇලුමිනියම් බේසම් | 01 |
| 05. | වානේ අල්මාරි | 22 |
| 06. | රූපවාහිනී අල්මාරි | 02 |
| 07. | ඉබි යතුරු | 48 |
| 08. | උල් අඩු | 01 |
| 09. | උදලු තල | 06 |
| 10. | ඕ. එච්. පී. මැෂින් | 01 |
| 11. | කැති | 04 |
| 12. | කල්දේරම් | 65 |
| 13. | කල්දේරම් රදවන | 02 |
| 14. | කොරොස් | 03 |
| 15. | කටර් අඩු | 01 |
| 16. | කුළුගෙඩි කැලි | 01 |
| 17. | ගිනි නිවන උපකරණ | 02 |
| 18. | ගෑස් සිලින්ඩර් | 03 |
| 19. | ගල් වංගෙඩි | 01 |
| 20. | ගුවන් විදුලි යන්ත්‍ර | 03 |
| 21. | ගෑස් කුකර් | 05 |
| 22. | ගෑස් ලිප් | 03 |
| 23. | ග්‍රයින්ඩර් | 01 |
| 24. | චේන් අඟල් 24 | 02 |
| 25. | ටෙස්ටර් | 01 |
| 26. | ඩෘගන් ලයිට් | 07 |
| 27. | ග්‍රිල් කටු | 04 |
| 28. | තැපැල් මුද්‍රණ යන්ත්‍ර | 01 |
| 29. | තාච්චි ලොකු/කුඩා | 08 |
| 30. | තණකොල කපන යන්ත්‍ර | 02 |
| 31. | නැබිලි | 03 |
| 32. | පරිඝනක | 04 |
| 33. | පුටු විධායක | 03 |
| 34. | පැට්‍රල් මැක්ස් | 07 |
| 35. | පුටු ඇඳි සහිත කුෂන් | 08 |
| 36. | පුටු යකඩ | 91 |
| 37. | පුටු යකඩ (කුෂන්) | 48 |
| 38. | පොත් රාක්ක (යකඩ) | 01 |
| 39. | පිහියා | 11 |
| 40. | පාපැදි ඩයිනමෝ | 09 |
| 41. | පුටු පරිගණක | 04 |
| 42. | පරිගණක බැටරි | 27 |
| 43. | පීරි | 06 |
| 44. | පොලිෂර් මැෂින් | 01 |
| 45. | ප්‍රින්ටර් | 06 |
| 47. | පොටෝකොපි යන්ත්‍ර | 03 |
| 48. | පොරෝ තල | 06 |
| 49. | ෆැක්ස් යන්ත්‍ර | 25 |
| 50. | පාපැදි පිරිමි | 59 |
| 51. | බන්ඩි කියත් | 01 |
| 52. | බෝල්ට් ඇණ | 02 |
| 53. | බිත්ති විදුලි පංකා | 10 |
| 54. | බාල්දි ලොකු/කුඩා | 08 |
| 55. | මොනිටර් එච්. පී. | 08 |
| 56. | මාර්ග පරීක්ෂා කරන යකඩ කූරු | 05 |
| 57. | මුට්ටි ඇලුමිනියම් | 01 |
| 58. | මේස හිරමනා | 02 |
| 59. | මැෂින් යතු තල | 01 |
| 60. | මේස යකඩ | 02 |
| 61. | මෙස් ටින් | 160 |
| 62. | මල්ටි පොට් | 03 |
| 63. | යතුරු ලියන සිංහල | 11 |
| 64. | යතුරු ලියන ඉංග්‍රීසි | 01 |
| 65. | රූපවාහිනී යන්ත්‍ර | 14 |
| 66. | රෝනියෝ මැෂින් | 01 |
| 67. | රයිස් කුකර් | 03 |
| 68. | රේක්ක | 02 |
| 69. | රෙදි සෝදන යන්ත්‍ර | 01 |
| 70. | ලන්තෑරුම් | 144 |
| 71. | ලැගේජ් කැරියර් | 02 |
| 72. | වතුර පිල්ටර් උණුසුම්/සිසිල් | 05 |
| 73. | විදුලි ලාම්පු | 09 |
| 74. | වතුර මෝටර් | 11 |
| 75. | විදුලි පන්දම් | 11 |
| 76. | විදුලි කේතල් | 08 |
| 77. | විදුලි වතුර බොලිලේරු | 16 |
| 78. | වතුර පිල්ටර් | 25 |
| 79. | ව්‍යායාම මැෂින් | 04 |
| 80. | වතුර පොම්ප | 02 |
| 81. | විදුලි ස්ත්‍රික්ක | 06 |
| 82. | වායු සමීකරණ යන්ත්‍ර | 01 |
| 83. | වතුර ටැංකි රඳවන | 03 |
| 84. | විදුලි හිරමනා | 01 |
| 85. | මේස විදුලි පංකා | 05 |
| 86. | විදුලි උදුන් | 01 |
| 87. | විසි කැති | 06 |
| 88. | වැකුම් ක්ලිනර් | 01 |
| 89. | සිටුවන විදුලි පංකා | 05 |
| 90. | ශීතකරණ | 04 |
| 91. | සාස් පාන් | 04 |
| 92. | සවල් | 04 |
| 93. | ස්කෑනර් යන්ත්‍ර | 01 |
| 94. | සිවිලින් විදුලි පංකා | 110 |
| 95. | සරනේරු බිත්ති | 02 |
| 96. | සරනේරු දොර | 11 |
| 97. | සරනේරු ජනෙල් | 10 |
| 98. | ස්ටීල් ජොග්ගු | 02 |
| 99. | ස්ටේප්ලර් මැෂින් | 01 |
| 100. | යකඩ ට්‍රවල් ට්‍රැක් | 01 |
| 101. | හැලජන් ලාම්පු වොට් 500 | 24 |
| 102. | හිරමනා තල | 03 |
| 103. | වානේ ෆයිල් කබඩ් | 01 |
| 104. | තෙල් හැඳි | 03 |
| 105. | මාලු කපන පිහියා | 04 |
| 106. | ගෑස් ලිප් 22 x 22 | 01 |
| 107. | කියත් තල | 04 |
| 105. | ආරෝපිත විදුලි පන්දම් | 02 |
| 109. | 7044 වයර් මීටර් | 368 |
| 110. | රින්ච් යතුරු | 02 |
| 111. | ඇලුමිනියම් ඉනිමන් | 01 |
| 112. | කම්බි කොකු | 03 |
| 113. | මාර්ග බාධක (බැරිකේඩ්) | 03 |
| 114. | අයන් ප්‍රොඩස් ජෝඩු | 01 |
| 115. | හයි ස්පිඩ කියත්තල | 05 |

07-737

### මහාධිකරණය - කල්මුණේ

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

කල්මුණේ මහාධිකරණ නඩු විභාගවලදී අත්පත් කරන ලද පහත සඳහන් භාණ්ඩ 2019.07.25 වැනි දින පෙ. ව. 9.00 ට කල්මුණ මහාධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධියේ වෙන්දේසි කිරීමට නියමිතය.

මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට් පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ වහාම අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු ය. මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසිය සිදු කරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හඳුනාගැනීමේ ලේඛන සමග පැමිණිය යුතු ය.

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය

| අනු. අංකය | නඩු අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | HC/KAL/280/2013 | EP TD-3139 | බජාජ් ඩිස්කවරි යතුරු පැදියක් | 01 |
| 02. | EP/HCK/330/2016 | UP TC-5166 | බජාජ් ඩිස්කවරි යතුරු පැදියක් | 01 |

මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
කල්මුණේ.

2019 ජුනි මස 28 වැනි දින.

07-702

---

### මහෙස්ත්‍රාත් අධිකරණය - යාපනය

අධිකරණය මගින් රාජසන්නත කරන ලද හා මෙතෙක් අයිතිවාසිකම් පවරනු නොලැබූ භාණ්ඩ වෙන්දේසිය සඳහා

යාපනය මහෙස්ත්‍රාත් අධිකරණයේ පහත සඳහන් නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ මෙම අධිකරණය භූමිය තුළ 2019.08.03 දින පෙ.ව. 9.30 ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට නියමිත යි.

02. මෙහි පහත සඳහන් කරනු ලැබූ කිසියම් භාණ්ඩයක් සඳහා කිසිවකු විසින් හිමිකම් පාන්නේ නම් නම ඉල්ලීම වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට පෙර මහජනයා විසින් මෙම භාණ්ඩ නැරඹිය හැක.

04. ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණීමට තබා ඇති යම්කිසි භාණ්ඩයක අවම ලංසුව නොලැබුණේ නම් වෙන්දේසියේදී එම භාණ්ඩ ආපසු ලබා ගැනීමේ අයිතිය අධිකරණය සතු යි.

05. විකුණනු ලැබූ භාණ්ඩවලට එවෙලෙහිම මුදල් ගෙවා භාණ්ඩ ඉවත් කළ යුතුයි. සෑම ගෙවීමක්ම මුදලින්ම ගෙවිය යුතු වන අතර චෙක්පත් භාර ගනු නොලැබේ. භාණ්ඩ මිලදී ගන්නා අය ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුයි.

ඒ. පීටර් පෝල්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
යාපනය

#### පාපැදිය හා වාහන කැසට් යන්ත්‍රය හා ජංගම දුරකථන හා සවල හා රන්භාණ්ඩ නිෂ්පාදන කරන භාණ්ඩ

| අනු අංකය | නඩු අංකය | නඩු බඩු අංකය | වාහන අංකය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | AR/162/18 | 247/18 | 69846135 | 1 පාපැදිය |
| 2 | AR/162/18 | 248/18 | CT9507492 | 1 පාපැදිය |
| 3 | BR/1239/PC/16/ MC/2064/PC/17 | 583/16 | 69742831 | 1 පාපැදිය |
| 4 | B/367/PC/17/ MC/1327/PC/17 | 508/17 | 69958261 | 1 පාපැදිය |
| 5 | B/367/PC/17/ MC/1327/PC/17 | 509/17 | 6980500 | 1 පාපැදිය |
| 6 | BR/672/PC/17/ MC/1762/PC17 | 1001/17 | 56071602 | 1 පාපැදිය |
| 7 | AR/1063/17 | 1856/17 | 69746962 | 1 පාපැදිය |
| 8 | BR/512/MT/18/ MC/1857/MT/18 | 566/18 | 1185946 | 1 පාපැදිය |
| 9 | AR/164/18 | 180/18 | FNR 0881V | 1 පාපැදිය |
| 10 | AR/1031/18 | 1280/18 | 69934010 | 1 පාපැදිය |
| 11 | AR/1090/18 | 1438/18 | 69925327 | 1 පාපැදිය |
| 12 | BR/1396/PC/16/ MC/1569/PC//17 | 612/16 | 69825168 | 1 පාපැදිය |
| 13 | BR/570/PC/18/ MC/2082/PC/18 | 633/18 | 6996853 | 1 පාපැදිය |
| 14 | BR/919/PC/18/ MC/3042/PC/18 | 1466/18 | අංක නැ | 1 පාපැදිය |
| 15 | AR/981/18 | 920/18 | 69993674 | 1 පාපැදිය |
| 16 | AR/981/18 | 921/18 | 69977004 | 1 පාපැදිය |
| 17 | AR/981/18 | 922/18 | 69896706 | 1 පාපැදිය |
| 18 | AR/981/18 | 924/18 | 69900938 | 1 පාපැදිය |
| 19 | AR/981/18 | 925/18 | 68245407 | 1 පාපැදිය |
| 20 | AR/981/18 | 926/18 | S. LL 041650 | 1 පාපැදිය |
| 21 | AR/981/18 | 1429/18 | 69814192 | 1 පාපැදිය |
| 22 | AR/981/18 | 1688/18 | 69808828 | 1 පාපැදිය |
| 23 | AR/981/18 | 1689/18 | 70005049 | 1 පාපැදිය |
| 24 | AR/981/18 | 1690/18 | 60927623 | 1පාපැදිය |
| 25 | AR/981/18 | 1801/18 | අංක නැ. | 1 පාපැදිය |
| 26 | AR/981/18 | 927/18 | CDSGT 29051621127 කැසට් යන්ත්‍රය | |
| 27 | AR/981/18 | 928/18 | DEH 14504G කැසට් යන්ත්‍රය | |
| 28 | AR/981/18 | 929/18 | DEHX 19504B කැසට් යන්ත්‍රය | 4 |
| 29 | AR/981/18 | 930/18 | DEHX 18504B කැසට් යන්ත්‍රය | |
| 30 | BR/236/14 | 152/14 | දුරකථන - 01 | 2 |
| | 37334 | 154/14 | දුරකථනය - 01 | |
| 31 | MC/1355/S/17 | 754/17 | සවල - 02 | 2 |
| 32 | MC/1226/S/17 | 685/17 | සවල - 01 | 1 |
| 33 | BR/557/18/ MC/1417/S/18 | 830/18 | සවල - 01 | 1 |
| 34 | BR/284/S/18/ MC/1270/S/18 | 378/18 | සවල - 03 | 3 |
| 35 | BR/709/S/18/ MC1755/S/18 | 1087/18 | සවල - 01 | 1 |
| 36 | BR/751/S/18/ MC/1908/18 | 1203/18 | සවල - 01 | 1 |
| 37 | BR/1327/ MC/18/1725/18 | 2301/17 | සවල - 02 | 2 |
| 38 | BR/452/S/18 MC/1616/S/18 | 681/18 | සවල - 01 | 1 |
| 39 | MC/1825/S/17 | 1097/18 | සවල - 01 | 1 |
| 40 | BR/937/S/18/ MC/2911/S/18 | 1493/18 | සවල - 01 | 1 |
| 41 | MC/1510/S/18 | 695/18 | සවල - 01 | 1 |
| 42 | B/453/S/18/ MC/1617/S/18 | 683/18 | සවල - 01 | 1 |
| 43 | BR/93/S/19/ MC/599/S/19 | 90/19 | සවල - 01 | 1 |
| 44 | BR/959/S/19 / MC/971/S/19 | 1313/19 | සවල - 03 | 3 |
| 45 | BR/958/S/18/ MC/521/S/19 | 1437/17 | සවල - 03 | 3 |
| 46 | BR/107/S/19 / MC/401/S/19 | 1411/17 | සවල - 04 | 4 |
| 47 | BR/64/S/19/ MC/361/19 | 1423/17 | සවල - 01 | 1 |
| 48 | BR/339/S/19/ MC/1064/S/19 | 1413/17 | සවල - 02 | 2 |

07-767

---

### හෝමාගම මහෙස්ත්‍රාත් අධිකරණය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හෝමාගම මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජ සන්තක කරන ලද, හිමිකම් නොකියන ලද භාණ්ඩ 2019.07.27 දින පෙරවරු 10.00 මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. මෙහි වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙරවරු 9.00 සිට 9.30 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

2. වෙන්දේසි කිරීමට පැය 1/2 ට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

3. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතුය.

4. අධිකරණ විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණය අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නේ නම් ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.

6. වෙන්දේසි සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම් ඒ අවස්ථාවේදී ම ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාර ගනු නොලැබේ.

උදේශ් රණතුංග,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
හෝමාගම.

2019 ජූලි 11 වැනි දින,
හෝමාගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 20484/18 | කි. ග්‍රෑ 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 02. | 15688/18 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 03. | 15317/17 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස්ලිප් | 01 |
| 04. | 03469/16 | කි. ග්‍රෑ. 5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 05. | 21679/18 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 06. | 07064/16 | කි. ග්‍රෑ. 12 ගෑස් සිලින්ඩර් | 02 |
| | | ගෑස් ලිප් | 01 |
| 07. | 13242/17 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 02 |
| | | ගෑස් ලිප් | 02 |
| 08. | 11624/17 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 09. | 19124/18 | කි.ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 02 |
| | | ගෑස් ලිප් | 01 |
| 10. | 13281/17 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 04 |
| | | ගෑස් ලිප් | 02 |
| 11. | 10377/17 | කි. ග්‍රෑ. 12.5ගෑස් සිලින්ඩර් | 02 |
| 12. | 16999/18 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 13. | 26930/19 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 14. | 25088/19 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 15. | 15878/18 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලිනඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 16. | 25153/19 | ගෑස් ලිප් | 01 |
| 17. | 24954/19 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 18. | 26062/19 | ගෑස් ලිප් | 01 |
| | | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| 19. | 26130/19 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 20. | 26598/10 | ගෑස් ලිප් | 01 |
| 21. | 26832/19 | කි. ග්‍රෑ. 12. 5 ගෑස් සිලින්ඩර් | 01 |
| 22. | 27227/19 | ගෑස් ලිප් | 01 |
| 23. | 27627/19 | කි. ග්‍රෑ. 12.5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | රෙගියුලේරටරය සහිත ගෑස් ලිප් | 01 |
| 24. | 26751/19 | ගෑස් ලිප් (කැඩී ඇත) | 01 |
| 25. | 28436/19 | කි. ග්‍රෑ. 5 ගෑස් සිලින්ඩර් | 01 |
| | | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 |
| 26. | 29005/19 | රෙගියුලේටරය සහ ආධාරකය සහිත ගෑස් ලිප් | 01 |
| 27. | 14102/10(B8524) | ජංගම දුරකථන | 01 |
| 28. | 82371(B253) | සෙන්ට්‍රික් වතුර මෝටර් | 01 |
| 29. | 85383 (B2630/06) | එලිෆන්ට් හවුස් ශීතකරණ | 01 |
| 30. | 31193 (B4289/13) | කැබලි 02 ක් ලෙස ඇති වතුර මෝටර් | 01 |
| | | චේන් බොලොක්ක | 01 |
| 31. | 95399 (B5812) | ත්‍රීරෝද රථ බැටරි | 01 |
| 32. | 32106/14 | සවල් | 01 |
| | | විල්බැරෝ | 01 |
| 33. | 92918/10 (B4138) | වයර් තොගයක් | |
| 34. | 19026/10 (B8116) | ජංගම දුරකථන | 02 |
| 35. | 89490 (B3534/4) | ජංගම දුරකථන | 01 |
| 36. | 10344 | පටිය රහිත ඔරලෝසු | 01 |
| | | ජංගම දුරකථන | 01 |
| 37. | 25520/19 | කාන්තා අත් ඔරලෝසු | 01 |
| 38. | 27287/19 | විදුලි පන්දම් | 01 |
| 39. | 24903/19 | සපත්තු ජෝඩු | 01 |
| 40. | 24907/19 | අඳනකඩ | 01 |
| 41. | 11827/19 | වතුර මෝටර් | 01 |
| 42. | 19509/12 | උදළු | 03 |
| | | සවල් | 02 |
| 43. | AR446 | රත්තරන් කරාබු ජෝඩු | 01 |
| | | රත්තරන් සුර | 01 |
| 44. | 04122/16 | රත්තරන් දම්වැල් චේන් | 01 |
| | | රත්තරන් පෙන්ඩන්ට් | |
| | | රත්තරන් මුදු | 01 |
| | | රත්තරන් මුදු | 01 |
| | | රත්තරන් දම්වැල් චේන් | 01 |
| | | රත්තරන් මුදු | 01 |
| | | රත්තරන් මුදු | 01 |
| 45. | 24613 | රත්තරන් දම්වැල් චේන් | 01 |
| 46. | B9322/11 | රන් කැබලි | 01 |
| 47. | AR450/15 | රත්තරන් පෙන්ඩන්ට් | 01 |
| | | රත්තරන් පෙන්ඩන්ට් | 01 |
| | | රත්තරන් දම්වැල් චේන් | 01 |
| 48. | AR1925/16 | රත්තරන් පෙන්ඩන්ට් | 01 |
| 49. | AR1924/16 | රත්තරන් පෙන්ඩන්ට් | 01 |
| 50. | AR1926 | රත්තරන් මුදු | 01 |
| 51. | B2871/13 | රත්තරන් දම්වැල් චේන් | 01 |
| | | රත්තරන් දම්වැල් චේන් | 01 |
| 52. | 10613/17 | HX 8569 යතුරු පැදිය | |
| 53. | AR1277/16 | ME 9954 යතුරු පැදිය | |
| 54. | AR1389/16 | MV 5834 යතුරුපැදිය | |
| 55. | AR2644/16 | BAF1691 යතුර පැදිය | |
| 56. | AR1846/16 | 124-4433 යතුර පැදිය | |
| 57. | 3041/16 (B8691/15) | WD9185 යතුර පැදිය | (කොටස්) |
| 58. | 38212 (B3972/13) | 50 ශ්‍රී 2670 වෑන් රථය | (අබලි) |
| | | 50 ශ්‍රී 2670 නිසාන් කැබ් රථය (අබලි) | |
| 59 | 19653 (B57/11) | 227-3646 මැස්ඩා ලොරිය | (අබලි) |
| | | ටොයොටා ලෑන්ඩ් කෲසර් රථය | (අබලි) |
| | | නිසාන් කැබ් රථය | (අබලි) |
| | | ටොයොටා ලෑන්ඩ් කෲසර් රථය (අබලි) | |
| | | ඉසුසු ටෲපර් රථය | (අබලි) |
| 60. | AR231/15 | HY1896 යතුරු පැදිය | (අබලි) |
| 61. | AR1015/13 | 152-2214 යතුර පැදිය | (අබලි) |

07-893

**මහෙස්ත්‍රාත් අධිකරණය - ත්‍රිකුණාමලය**

නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2019.07.25

ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කර ඇති හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2019.07.25 වැනි දින ප. ව. 3.00 ට කින්නියා පොලිස් ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම හිමිකම් ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

05. ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් රැගෙන පැමිණිය යුතු ය.

එම්. එච්. එම්. හම්සා,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ත්‍රිකුණාමලය.

ප්‍රසිද්ධ වෙන්දේසියේ නඩු භාණ්ඩ විස්තරය - 2019.07.25

| *අනු. අංකය* | *නඩු අංකය* | *නඩු භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | MC 1981/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 275 |
| 02. | MC 1760/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 150 |
| 03. | MC 1435/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 350 |
| 04. | MC 1765/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 200 |
| 05. | MC 3288/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 185 |
| 06. | MC 3548/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 150 |
| 07. | MC 3556/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 360 |
| 08. | MC 3801/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 450 |
| 09. | MC 4013/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 12 |
| 10. | MC 3938/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 46 |
| 11. | MC 3939/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 360 |
| 12. | MC 3941/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 184 |
| 13. | MC 1100/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) | 18 |
| 14. | BR 10/18 | සිප්පි කටු උර (කි. ග්‍රෑ. 50 බැගින්) - චින වරාය පොලිසියේ | 150 |
| 15. | නඩු අංක නොමැති | වැලි චින වරාය පොලිසියේ | කියුබ් 07 |
| 16. | නඩු අංක නොමැති | වැලි කින්නියා පොලිසියේ | කියුබ් 152 |
| 17. | නඩු අංක නොමැති | බොරළු කින්නියා පොලිසියේ | කියුබ් 56 |
| 18. | MC 2584/15 | SH - 5942 දරන අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය කින්නියා පොලිසියේ | 01 |
| 19. | MC 3402/16 | SA - 9262 දරන අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය කින්නියා පොලිසියේ | 01 |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**රත්නපුර දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම - 2020 වර්ෂය**

පින්නවල අංක 02 රා තැබෑරුම

2020 ජනවාරි මස 01 වැනි දින සිට 2020 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාල සීමාව තුළ මෙහි උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශයේ පැසුණු රා සිල්ලරට විකිණීම පිණිස ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

01. මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූල විය යුතුයි :-

(i) 1982.08.20 වැනි දින අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව; හා

(ii) සුරා බදු නිවේදනයෙහි දැක්වෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු කොන්දේසි මාලාවට යටත්ව ය.

02. සෑම ටෙන්ඩර් අයදුම්පතක් වෙනුවෙන්ම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක හෝ ලංකා බැංකු, දිස්ත්‍රික් ලේකම් ශාඛාවක මුදල් තැන්පත් කළ බවට ලදුපතක් ටෙන්ඩරයට අමුණා එවිය යුතු ය. පින්නවල අංක 02 තැබෑරුම සඳහා රු. 1,500 ක් තැන්පත් කළ යුතු වේ.

03. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ද, කොළඹ සුරා බදු කාර්යාලයකින් ද, ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පත්‍රය කවරයක බහා සීල් තබා එහි කෙළවර මුදුනේ "පින්නවල අංක 02 තැබෑරුම සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර්පත " බව පැහැදිලිව සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත් වීමට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඹුල්පෙ" යන ලිපිනයට එවිය යුතු ය. නැතහොත් ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. සෑම ටෙන්ඩර්කරුවෙක්ම තමාගේ නමින්ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

05. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පතකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවලුන් විසින් සාමූහිකව ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

06. ටෙන්ඩර් කරන මුදල ඉලක්කමෙන් සහ අකුරෙන් එවිය යුතු ය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ අත්සන හා දිනය යොදා සහතික කළ යුතු ය. සෑම ටෙන්ඩරයක්ම දෙදෙනෙකු විසින් ද අත්සන් කළ යුතු ය. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කළ හැකි ය.

07. ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිල දී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින් රේන්ද විකිණීමේ කොන්දේසියට අත්සන් තබා ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල්, ඇප තැන්පත් වශයෙන් තැන්පත් කළ යුතු ය.

08. 2019 සැප්තැම්බර් මස 11 වැනි දින පෙ.ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එකී නියමිත වේලාවට ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

09. කිසිම හේතුවක් නොදන්වා ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට පැවරී ඇත.

10. පූර්වෝක්ත දිනයේ විකිණීමට නොහැකි වූ තැබෑරුමක්, රේන්දයක් වෙතොත් ඒවා නැවත විකිණීම 2019.11.01 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. 2019 වර්ෂය සඳහා දැනට තැබෑරුම පවත්වාගෙන යනු ලබන ස්ථානය ලබා ගත හැකිදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළ ගොඩනැගිලි සොයා ගත යුතු අතර එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වේ. ගොඩනැගිලි සොයා දීමට බලපත්‍ර අධිකාරිය බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

බී. එම්. බී. එම්. ඒ. බටුගෙදර,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

2019 ජූලි මස 02 වැනි දින,
ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *පිහිටි ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කර තැබිය යුතු වේලාවන්* | *ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| පින්නවල රා තැබෑරුම අංක 02 | කඩවත කෝරළය | පින්නවල ගම තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2019.09.11 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

07-648

**ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - බදුල්ල**

2020 වර්ෂය සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්දය විකිණීම

2020 ජනවාරි මස 01 වැනි දින සිට 2020 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, 2019.08.06 වැනි දින පෙරවරු 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබා ගැනීමට ඉදිරිපත්වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියමකර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් රිසිට්පත හා ටෙන්ඩරයේ වටිනාකමෙන් 15% ට වඩා වටිනාකමින් යුත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම සම්පූර්ණ අත්සන යොදා සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් භාර ගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2019.08.06 වැනි දින පෙරවරු 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2019.10.02 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින පස්වරු 2.00 ට පෙර බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදලට වඩා වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැන ගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

එන්. එම්. ඥාණවතී,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2019 ජූලි මස 03 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**"බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය" 2020 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම පිළිබඳ විස්තර 2020.01.01 වැනි දින සිට 2020.12.31 වැනි දින දක්වා**

| *තැබෑරුමේ නම සහ ලිපිනය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රා. ලේ. කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| බදුල්ල අංක 01 රා තැබෑරුම | බදුල්ල | බදුල්ල මහ නගර සභා අංක 06 දරන කොට්ඨාසයේ හුණුකොටුව නමැති රජයේ ඉඩම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 5,000 | 2019.08.06 පෙ.ව.10.30<br>**නැවත විකුණන දිනය .- සාර්ථක** ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවුවහොත්<br><br>2019.10.02 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කෙරේ. |

07-700

# රජයේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ

බදුල්ල, පහළ වීදිය, අංක 48 හි පදිංචි තිලක් චන්දන හේමන්ත මෙන්ඩිස් (640640030 V) වන මා විසින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් බදුල්ල, පහල වීදිය අංක 48 හි පදිංචි චන්ද්‍රා දික්වැල්ල මෙන්ඩිස් (457390475 V) යන අය වෙත රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බලපත්‍ර පොතේ අංක 249 කාණ්ඩයේ 154 පත්ඉරුවේ 616 දිනපොත් අංක යටතේ ලියාපදිංචි කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් පී. සී. එන්. බොතේජු මහතා විසින් 2002.12.04 වැනි දින සහතික කරන ලද අංක 41 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශූන්‍ය කර බලරහිත කර සිටිමි. මෙතැන් සිට එකී චන්ද්‍රා දික්වැල්ල මැන්ඩිස් යන අය මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුලත් වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් හා වගකියනු නොලබන බව ද මෙයින් දැනුම් දෙමි.

තිලක් චන්දන හේමන්ත මෙන්ඩිස්.

07-468

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව ෆේවරිට් හන්වැල්ල (ප්‍රයිවට්) ලිමිටඩ් නම මැජී ලංකා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් නම වෙනස් කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙන්නෙමු.

පෙර පැවති නම : ෆේවරිට් හන්වැල්ල (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 7552
ලියාපදිංචි ලිපිනය : සුදුවැල්ල, කලුඅග්ගල, හංවැල්ල
සමාගමේ නව නම : මැජී ලංකා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සිලෝන් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-470

**මහජනතාව වෙත දැනුම්දීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම සංස්ථාපනය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : චමායා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00211905
ලියාපදිංචි දිනය : 2019.05.22
ලියාපදිංචි කාර්යාලය : චමායා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක - 33J, දොරවෙල පාර, බලන්ගොඩ.

සමාගම් ලේකම්.

07-489

### ප්‍රසිද්ධ දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම් නීත්‍යානුකූල සමාගම් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : ජේ. පී. එන්. කෝපරේට් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 00209125
සමාගමේ ලියාපදිංචි දිනය : 2019.02.21
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14, ශ්‍රී ධර්මකීර්තියාරාම පාර, කොළඹ 03

මාණ්ඩලික නියෝගයක් මත ඒ. එෆ්. ඒ.
කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-504/1

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම් නීත්‍යානුකූල සමාගම් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : ස්කයිලිෆ්ට් කන්ටේනර් ඩිපෝට් ඇන්ඩ් ලොජිස්ටික්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 00207401
සමාගමේ ලියාපදිංචි දිනය : 2018.12.21
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 540/සී, සමෘද්ධි මාවත, වල්ගම, මල්වාන.

මාණ්ඩලික නියෝගයක් මත ඒ. එෆ්. ඒ,
කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-504/2

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : නානි බහායි ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 00209817
සමාගමේ ලියාපදිංචි දිනය : 2019.03.13
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 59 ඊ, සපුගස්කන්ද, මාකොළ, කැලණිය.

මාණ්ඩලික නියෝගයක් මත ඒ. එෆ්. ඒ,
කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-504/3

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම් නීත්‍යානුකූල සමාගම් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නාමය : ඉන්ටර්නැෂනල් ඉනොවේෂන් කොන්සෝටියම් (ගරන්ටි) සමාගම
සමාගමේ ලියාපදිංචි අංකය : ජී එල් 00210795
සමාගමේ ලියාපදිංචි දිනය : 2019.04.04
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 14, ශ්‍රී ධර්මකීර්තියාරාම පාර, කොළඹ.

මාණ්ඩලික නියෝගයක් මත ඒ. එෆ්. ඒ
කෝපරේට් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

07-504/4

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : බයෝකොයිල් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පීවී 00211681
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : දූඹුළුවැව එස්ටේට් ගිනිමන්ඩාවල, දීගල්ල, කුලියාපිටිය
සමාගම ලියපදිංචි කළ දිනය : 2019.05.11

සමාගම් ලේකම්වරු.

07-505

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

ජාතික හැඳුනුම්පත් අංක 762674025 V හිමි, පත්තුප්පනයියඩි, අලෙවෙඩ්ඩි උතුර, යාපනය යන ලිපිනයෙහි සච්චිතානන්දම් වසන්ත කුමාර් වන මම, ශ්‍රී ලංකාවේ පොදු ජනතාව වෙත දන්වා සිටින වගනම්, 2013.04.02 දිනැති අංක 9123 දරන ලියවිල්ලෙන් මා විසින් එන්. තම්පිමුත්තන් නම් වූ යාපනයේ ප්‍රසිද්ධ නොතාරිස් සහතික කරන ලදුව, කරනවායි දකුණ, කරවෙඩ්ඩි ලිපිනයෙහි ජාතික හැඳුනුම්පත් අංක 8631441156V හිමි තරුමරාජ, තිරුනීපන් වෙත පවරන ලද ඇටෝර්නි බලය අවලංගු කර අහෝසිකර ඇති බවත්, එමෙන් ම තවදුරටත් ප්‍රකාශ කර සිටින වගනම් එකී ඇටෝර්නි බලය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර අහෝසිකර ඇති බවත්, එබැවින් එකී ඇටෝර්නි බලය සිදුකරන කිසිදු ක්‍රියාවකට හෝ කාර්යකට මා විසින් කිසිදු වගකීමක් නොදරන බවත් ය.

සච්චිතානන්දම් වසන්ත කුමාර්.

2019 ජුනි 18 දිනයේ දී ය.

07-507

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : පිලපිටිය හර්බල් ප්‍රඩක්ට්ස් ඇන්ඩ් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 67573
සංස්ථාගත කළ දිනය : 2009.04.16
ලිපිනය : අංක 126, පිලිපිටිය වෙදමැදුර, කැස්බෑව, පිළියන්දල.

අධ්‍යක්ෂ.

07-538

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් සමාගම ලියාපදිංචි කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ඩෙසොලේෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00212877
සංස්ථාගත කළ දිනය : 2019.06.21
ලියාපදිංචි ලිපිනය : අංක 36 බී, ෂර්බරි උද්‍යානය, කොළඹ 04.

සමාගම් ලේකම්.

07-550

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුගාමීව පහත සඳහන් පුද්ගලික සීමිත වගකීම් සමාගම 2019 ජනවාරි මස 31 වැනි දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : මොලිනෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00208343
ලියාපදිංචි කාර්යාලය : අංක 136/28, ජෝර්ජ්. ආර්. ද සිල්වා මාවත, කොටහේන, කොළඹ 13.

එච්. ඒ. වයි. කුමාර හෙට්ටිආරච්චි,
සමාගම් ලේකම්.

අංක 18 එල් ඒ,
ස්වර්ණවිමන,
වේයන්ගොඩ.

07-553

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුගාමීව පහත සඳහන් පුද්ගලික සීමිත වගකීම් සමාගම 2018 ජූලි මස 15 වැනි දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ආර් එස් ඩී ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00202026
ලියාපදිංචි කාර්යාලය : අංක 6/34/ඩී, සමාධි මාවත, කලගෙඩිහේන.

එස්. බී. ඩී. බී. සේමසිංහ,
අධ්‍යක්ෂක.

අංක 6/34/ඩී,
සමාධි මාවත,
කලගෙඩිහේන.

07-554

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සිලෝන් ස්පයිස් කාර්ට් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි කාර්යාලය : 1/11, ඇල්පිටිය පාර, අම්බලන්ගොඩ
සංස්ථාගත කළ දිනය : 2019 ජුනි 15
ලියාපදිංචි අංකය : පී වී 00212637

ජී. ජී. මධුර චින්තක,
සමාගම් ලේකම්.

07-555

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මඩකලපුව, තාමරයිකේණි වීදිය, අංක 20/5 සුකන්දා කුරුපරන් මහත්මිය (ජා. හැ. ප. අංකය 627950195 වී) යන මා ලංකාවේ 2007 වර්ෂයේ අංක 07 දරන සමාගම් පනත යටතේ නීතියානුකූල ආයතනයක් ලෙස සර්වෝදය සංවර්ධන ෆිනාන්ස් ලිමිටඩ් යන නමින් පීබී 3795 අංකය යටතේ නිසි පරිදි ඒකාබද්ධ කර ලියාපදිංචි කාර්යාලය ''අර්ත්තධර්ම කෙන්ටරයා'' අංක 45, රාවතාවත්ත පාර, මොරටුව යන ලිපිනයේ පිහිටි සමාගමට 2017.10.28 වැනි දින අංක 701 යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එන්. සී. නිරූජා විසින් සහතික කර මඩකලපුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2017.11.09 වැනි දින අංක ඊ 0015/143 සටහන් ලියාපදිංචි කළ මාගේ අංක 700, 2017.10.28 වැනි දිනැති ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එන්. සී. නිරූජා විසින් සහතික කළ ඉඩම් උකස් තබා ඉන් පසුව ඇති සියලු ප්‍රතිලාභ, හිමිකම් අත්හැර ලබාදුන් බලය අද සිට නීත්‍යානුකූලව ද නිල වශයෙන් ද අවලංගු කරමි.

සුකන්දා කුරුපරන්.

07-558

---

### සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය 27.05.19 දින සිට වෙනස් කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

පෙර නාමය : සන් ෂි හෙ (ගරන්ටි) ලිමිටඩ්
අළුත් නාමය : විශ්ව තරණි (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : ජීඑල් 2433
ලියාපදිංචි ලිපිනය : 177/1, මාකොළ පාර, කිරිබත්ගොඩ.

එම්. සිරිවර්ධන,
සමාගම් ලේකම්.

07-630

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගම් නාමය : කියෝෂින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 00211638
සංස්ථාපනය කරන ලද දිනය : 2019 මැයි 11
ලියාපදිංචි කාර්යාලය : 4 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

07-636/1

---

### සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගම් නාමය : වෝෆොන් ඩිවෙලොප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 00211842
සංස්ථාපනය කරන ලද දිනය : 2019 මැයි 21
ලියාපදිංචි කාර්යාලය : අංක 44/6, ජයසමගි මාවත, කළුබෝවිල, දෙහිවල.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

07-636/2

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කතලුව, වැලිපාර, කබලාන හි පදිංචි ගිල් ගොෆ්ෆෙර් (ඊශ්‍රායීල විදේශ ගමන් බලපත්‍ර අංක 14506756 සහ පොලන්ද්‍ර ගමන් බලපත්‍ර අංක EN 5338848) වන මා විසින් අහංගම, වේලහේනගොඩ, කබලන් හි පදිංචි ශ්‍රී බ්‍රක්මන ආරච්චි මුදියන්සේලාගේ රෂික මනෝජ් නමැති අයට 2018.10.31 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් එන්. බී. සඳුන් විජේවර්ධන විසින් සහතික කළ අංක 931 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී ඇටෝර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගනුදෙනුවකට මා වග නොකියන බව ද ප්‍රකාශ කරනු ලැබේ.

ගිල් ගොෆ්ෆෙර්.

07-637

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඕස්ට්‍රේලියාව, වික්ටෝරියා කැම්බවෙල්, ට්‍රම්ප වීදිය, අංක 7, වර්තමානයේ ශ්‍රී ලංකාව, කොළඹ 03, 5 19 වන පටුමග, අංක 2/2 හි පදිංචි ඇඩම් ඊස්ටන් වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවටත්, පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙන වගනම් මා විසින් ශ්‍රී ලංකාව, කොළඹ 03, 5 19 වන පටුමග, අංක 2/2 හි පදිංචි රොමේෂ් රණවන වෙත පවරන ලද වැලිගොඩගේ රවීන්ද්‍ර චම්පක ද සිල්වා, ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් ලියා සහතික කරන ලද අංක 178 සහ 2013 පෙබරවාරි මස 14 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියා කිරීමට මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත්කරමින් එම රොමේෂ් රණවන වෙත පවරන ලද ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බවත්, එසේ හෙයින් එකී ඇටර්නි බලය මත හා වෙනුවෙන් එකී රොමේෂ් රණවන යන අය විසින් කරනු ලබන ඕනෑම ක්‍රියාවකට ගණුදෙනුවකට කර්තව්‍යකට මා කිසිදු වගකීමක් නොදරනු ඇති බවත් දන්වා සිටින වගයි.

ඇඩම් ඊස්ටන්,
ඇටර්නි බල දීමනාකරු.

07-694

---

### වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඇරිමැක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 81513
ලියාපදිංචි කළ දිනය : 2011 සැප්තැම්බර් 27 වැනි දින
සමාගම ලියාපදිංචි කරන ලද දිනයේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 627, තලංගම දකුණ, බත්තරමුල්ල.

ඇරිමැක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2019 ජුනි මස 28 වැනි දින.

07-675

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ජගුවර් ෂිපිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 00212911
ලියාපදිංචි කාර්යාලය : නො. 35 ඒ, පංසල පාර, කොළඹ 10
සංස්ථාපනය කළ දිනය : 2019.06.24

සමාගම් ලේකම්.

07-707

---

### ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

මාලබේ, කහන්තොට පාර, නාමල් මාවත, අංක 98/10 බී හි පදිංචි, ජා. හැ. අංක 613341900 වී හිමි චෛතිය ජයන්ත් ජයකොඩි වන මම ජනතාවට මෙයින් දන්වා සිටින්නේ, කොළඹ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. රාජපක්ෂ මහත්මිය විසින් ලියා සහතික කළ 2017.04.23 දිනැති අංක 1638 දරන බත්තරමුල්ල, රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලේඛන ලියාපදිංචි කිරීමේ බලයලත් ලේඛනයේ 196 පිටුවේ 113 දරන පත්ඉරුවේ දිනපොත් අංක 6372 සහ 2017.04.27 දිනැතිව ලියාපදිංචි කර ඇති මා විසින් කටුගස්තොට, ගලගෙදර පාර, අංක 124 ඒ හි පදිංචි ජා. හැ. අංක 593400557 වී හිමි මහේන්ද්‍ර අජිත් හුලන්ගමුව යන අය වෙත දී ඇති ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවය.

මෙම දැන්වීම ප්‍රචාරය වන දින සිට ඉදිරියට එකී මාගේ ඇටෝර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ගණුදෙනුවකට හෝ වෙනයම් බැඳීමකට මා විසින් වගකීමක් නොදරන බව ද වැඩිදුරටත් මෙයින් දැනුම් දී සිටිමි.

චෛතිය ජයන්ත් ජයකොඩි.

07-721

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර නිව් ලංකා ඉන්ටර්නැෂනල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නාමය 2019 පෙබරවාරි මස 28 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි වෝක් ඉන් ලංකා ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය : නිව් ලංකා ඉන්ටර්නැෂනල් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 122011
ලියාපදිංචි කාර්යාලය : අංක 125/බී, ජෝර්ජ් මදුරසිංහ මාවත, අලුත්ගම, බෝගමුව, යක්කල
සමාගමේ නව නාමය : වෝක් ඉන් ලංකා ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.

07-722

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව දැන්වීම

| | | |
|---|---|---|
| ෂියාමා හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී | පීවී 00212221 | අම්පිටිය වත්ත, වෙල්හෙන්ගොඩ, අහංගම |
| ට්‍රම්ප්ස් ඩිජිටෙල් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 00211803 | 24, 1/2, ඇල්බර්ට් ක්‍රෙසන්ට්, කොළඹ 07 |
| වොයිස් ඔෆ් ඩිලිවරන්ස් | ජී ඒ 00211693 | අංක 165, 18 වැනි පාර තරනිකුලම්, වවුනියාව |
| සෝන් වන් හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී | පීවී 00212742 | අංක 20, අල්ගස්වත්ත පාර, කොළඹ 05. |

07-510

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගාල්ල ක්‍රිට්ස් පාරේ අංක 39 හි පදිංචි දුර්ගාදේවි සුජාතා අබේසිරිවර්ධන (ජා. හැ. අංක 476391555 V) වන මා විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රභාත් ඉලංගන්තිලක විසින් ලියා සහතික කරන ලද අංක 17626 සහ 2016 අගෝස්තු මස 28 දිනැති සහ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ඌව - සබරගමුව කලාප කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 16 වන කාණ්ඩයේ 178 පත්‍රිරුවේ අංක 1309 යටතේ ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය මගින් බණ්ඩාරවෙල අමුණුදෝව මවුන්ට් ලෙෂර් විලා හි පදිංචි වෙහෙරවත්ත කන්කානම්ලාගේ ලෙස්ලි තිලකරත්න (ජා. හැ. අංක 713082813 V) යන අයට පවරන ලද විශේෂ ඇටෝර්නි බලය 2019 ජුනි මස 15 දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයටත් එහි ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

දුර්ගාදේවි සුජාතා අබේසිරිවර්ධන.

07-777

## දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම සංස්ථාපනය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : පර්පල්ඩයිම් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00208699
ලියාපදිංචි දිනය : 2019.02.11
ලියාපදිංචි කාර්යාලය : 17/3 ඒ, බෝධිරාජ මාවත, ඕෆ් රූපසිංහ පාර, නැදිමාල, දෙහිවල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

07-776

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අලව්ව, හුංමුළුව, අලවලාකොටුව, අංක 457 හි පදිංචි ජා. හැ. ප. අංක 701432487 V හිමි වික්‍රමසිංහ මොහොප්පු ආරච්චිල්ලාගේ රෝහන් වික්‍රමසිංහ වන මම ගෝනුපිණුවල, කිත්තන්දූව පදිංචි ජා. හැ. ප. අංක 723390583 V හිමි ලේකම්වසම් හික්කඩුව ලියනගේ සිසිර කුමාරසිරි යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කරන ලද අලව්ව දොඩම් කුඹුරවත්ත පදිංචි ඉන්ද්‍රජිත් එස්. සී අමරසේකර ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කළ අංක 10373 සහ 2018.11.14 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය වර්ෂ 2019 ක් වූ ජුනි මස 26 වැනි දින පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙන අතර වර්ෂ 2019ක් වූ ජුනි මස 26 වැනි දින සිට ලේකම්වසම් හික්කඩුව ලියනගේ සිසිර කුමාරසිරි යන අය වෙනුවෙන් කිසිදු වගකීමක් නොදරන බව මම මෙයින් දැනුම් දෙමි.

පී. ඒ. එන්. මිරැන්ඩා.

07-984

---

## මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳව මහජනයා වෙත කෙරෙන දැනුම් දීමයි.

සමාගමේ පැරණි නම : වන්සීරෝ කම්පනි ලිමිටඩ්
සමාගමේ නව නාමය : සී බී සී ටෙක් සොලුෂන්ස් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 556
ලියාපදිංචි කාර්යාලය : ''වාණිජ නිවස'' අංක 21, ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත, කොළඹ 01
නම වෙනස් කළ දිනය : 2019.06.26

එම්. පී. දර්මසිරි,
සමාගම් ලේකම්.

07-856

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශෙෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ෆර්ස්ට් චොයිස් ලෑන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0178 1000 3111.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.05.02 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හාර කෝටි දහ හතර ලක්ෂ දහ තුන් දහස් අටසිය තිස් පහයි ශත හැට දෙකක (රු. 41,413,835.62) මුදල ද, 2019 මාර්තු මස 19 වැනි දින සිට අංක 2201 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටියක (රු. 40,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16.%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.06.14 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.06.06 දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.08.26 වැනි දින ප. ව. 2.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය සභා සහ කළුතර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කලපුගම බටහිර අංක 709 C ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පානදුර තොටමුනේ, වාද්දු වස්කඩු දෙබැද්ද කලපුගම ග්‍රාමයේ පිහිටි "හොරේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ජී. රණසිංහ යන අය විසින් සාදන ලද 2018 මාර්තු මස 13 දාතම හා අංක 5377 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 5 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 1, 2 සහ 4, නැගෙනහිරට : මෙහි ලොට් 4 සහ පාර (ප්‍රා.ස.), දකුණට : පස් කාණුව (පිටත) සහ බස්නාහිරට : ඩී. ටී. ඇතුළත්මුදලි සහ වෙනත් අයගේ හොරේවත්ත ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර හතරයි පර්චස් හයයි දශම පහයි බිංදුවක් (A:4, R:0, P:6.50) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5377 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව C 121/101 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 5 බලයලත් මානත තැන එස්. ජී. රණසිංහ විසින් සාදන ලද 2018 පෙබරවාරි මස 19 දාතම හා අංක 5352 දරන පිඹුරේ ලොට් 5 සහ 6 හි නැවත මිනුමක් සහ උපබෙදුමක් ද තවත් අයුරකින් පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩම්වල උපබෙදුමක් ද වේ.

1. එකී කලපුගම ග්‍රාමයේ පිහිටි "හොරේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. ටී. ගුණවර්ධන යන අය විසින් සාදන ලද 2000 ජූලි මස 15 සහ 16 දාතම හා අංක 2154A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන පාර සහ පාර, නැගෙනහිරට : පාර සහ මෙහි ලොට් 2 සහ 3, දකුණට : මෙහි ලොට් 2 සහ 3 සහ පී. කරෝලිස් පෙරේරා සහ වෙනත් අයට අයත් "කඩන්විල කුඹුර" සහ බස්නාහිරට : පාර සහ ඩී. ටී. ඇතුළත්මුදලි සහ වෙනත් අයගේ "හොරේවත්ත" යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර පහයි රූඩ් එකයි පර්චස් විසිපහක් (A:5, R:1, P:25) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2154A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව C 85/54 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී කලපුගම ග්‍රාමයේ පිහිටි "හොරේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. ටී. ගුණවර්ධන යන අය විසින් සාදන ලද 2000 ජූලි මස 15 සහ 16 දාතම හා අංක 2154A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 1 සහ 2, නැගෙනහිරට : පාර, දකුණට : පී. කරෝලිස් පෙරේරා සහ වෙනත් අයට අයත් "කඩන්විල කුඹුර" සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකක් (A:1, R:0, P:0) විශාල, ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2154A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 154/9 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එස්. ජී. රණසිංහ විසින් සාදන ලද 2018 මාර්තු මස 13 දාතම හා අංක 5377 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 දිගේ හා ඒ මතින් යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා සම්බන්ධ වෙනත් අයිතීන් ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-703

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

වෙකන්සා රිසෝට් ඇන්ඩ් කයිට්සර්ෆින් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0088 1000 1942.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.03.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන්කෝටි දහසය ලක්ෂ පනස් අට දහස් එකසිය අසූ අටයි ශත අසූවක (රු. 31,658,188.80) මුදලද, 2019 පෙබරවාරි මස 22 වැනි දින සිට අංක 2176 සහ 2494 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුලුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක (රු. 15,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට අටක් (8%) හා තවත් රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක (රු. 15,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි තුනක් (23%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.06.21 දින රජයේ ගැසට් පත්‍රයේ 2019.06.11 දින දිවයින, සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.08.23 දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කන්ඩකුලි කුඩාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කන්ඩකුලී කුඩාව පිහිටි "කන්ඩකුලී කොළණි" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. එස්. සබාර් යන අය විසින් සාදන ලද 2017.08.24 දාතම හා අංක 4420A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 (ප්‍රාදේශීය සභාවේ පාරෙන් කොටසක්), නැගෙනහිරට : ලොට් 3 (පිවිසුම) සහ ලොට් 2, දකුණට : ලොට් 2 සහ ලුසිඩා සහ බස්නාහිරට : සිමොන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් දෙකයි දශම තුනක් (A:0, R:2, P:32.3) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4420A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D/Ka/4/132 යටතේ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

### විශේෂිත වගන්තිය

1. මෙම දේපළ තුළ ඒ මත හා ඊට අයිතිව ඇති සියලුම ඛණිජ ද්‍රව්‍ය කැනීම, සෙවීම, ඒවා සම්බන්ධව වන කාර්යයන් සහ ඒවා රැගෙන යෑම ඉවත්කර ගැනීම සම්බන්ධව ඇති නීත්‍යානුකූල අයිතිය (මෙම අවසර ප්‍රදාන කොන්දේසියට මැණික් ගල් ඇතුළු පාෂාණයන් ද ඇතුළත් ය) රජය සතු ය.

2. මෙම දේපළට ඇති අයිතිකරුගේ නිත්‍යානුකූල අයිතිය, මෙම ප්‍රදානයේ දිනට දේපළ මත පවත්නා මාර්ග හා වෙනත් අයිතීන් හා වෙනත් ඕනෑම පරවශ්‍යතා අයිතීන්ට යටත්ය.

### කොන්දේසි

1. (හෙක්ටයාර 0.0379) හෙක්ටයාර/අක්කර උස් භූමිය, හෙක්ටයාර/අක්කර වාරි සම්පාදිත ඉඩම වැනි මෙහි නියම කොට ඇති උප බෙදුම්වල ඒකකයන්ගේ ප්‍රමාණයට අඩු ප්‍රමාණයෙන් යුත් දේපළෙන් බෙදූ කොටසක් බැහැර කිරීම අයිතිකරු විසින් නොකරනු ලැබිය යුතු ය.

2. 1/9 කොටසක් වන, මෙහි නියමකොට ඇති අවම කොටසට වඩා අඩු මෙම දේපළෙහි නොබෙදූ කොටසක් බැහැරකිරීම අයිතිකරු විසින් නොකළ යුතු ය.

3. කොන්දේසි 01 හි නියමකොට ඇති උප බෙදුම් ඒකකයට වඩා අඩු ප්‍රමාණයෙන් යුත් මෙම දේපළේ බෙදූ කොටසකට කිසිම පුද්ගලයෙකු හිමිකරුවකු නොවිය යුතු ය.

4. කොන්දේසි 02 හි නියමකොට ඇති අවම කොටසට වඩා අඩු ප්‍රමාණයෙන් යුත් මෙම දේපළේ නොබෙදූ කොටසකට කිසිම පුද්ගලයෙකු හිමිකරුවකු නොවිය යුතු ය.

5. ඉදිකිරීම් පරිපාටියේ දැනටමත් ඉදිකොට ඇති හෝ මින් මතුවට ඉදිකරනු ලබන ඕනෑම වාරිමාර්ග කාර්යයක් මගින් වාරිමාර්ග සම්පාදනය කළහැකි හෝ වාරිමාර්ග සම්පාදනය කළ හැකි බවට පත්වන මෙම දේපළ හෝ ඉන් කොටසක් හෝ වන වාරිමාර්ග සම්පාදනය කළ හැකි පෙදෙස හා සම්බන්ධයෙන් වාරිමාර්ග ආඥාපනත (පරිඡේද 453) නියමයන්ට අනුකූලව හා එහි අඩංගු කොට ඇති ඕනෑම නීතිරීතියක් අනුගමනය කිරීමට අයිතිකරු බැඳිසිටී.

6. අදාළ දිසාපතිතුමාගෙන් ලිඛිත අවසරයක් සහ නියමිත අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගෙන නොමැති නම් මෙම ඉඩමේ හෝ එහි මත හෝ එයට අයත් හෝ ඕනෑම ඛනිජ බැහැර කිරීමක් හෝ වෙනත් අයුරකින් කැනීමක් සෙවිල්ලක් ලබාගැනීමක් අනුයෝජනයක් හෝ විකිණීමක් අයිතිකරු විසින් නොකළ යුතු ය.

7. ප්‍රාදේශීය ලේකම්තුමාගේ පූර්ව ලිඛිත අවසරයකින් හැර මෙම දේපළ හෝ මෙහි ඕනෑම කොටසක් හෝ පවරාදීමක් නොකළ යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-704

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ස්ථිර අයිරා පහසුකම් අංකය - 0077729230
අලවතුගොඩ, මාතලේ පාර, අංක 643/A හි ශ්‍රී ඩෙල්ලා නැචුරා (පුද්ගලික) සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 අප්‍රේල් 18 දිනැති අංක 2120 දරන ගැසට් පත්‍රයේ හා 2019 අප්‍රේල් 08 වැනි දින ''ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2019 සැප්තැම්බර් මස 04 වැනි බදාදා දින පෙ. ව. 9.30 ට, කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව, උඩගම්පහ කෝරළේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභාවේ අංක 584 දරන අරඹේපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අරඹේපොල පිහිටි "ගෙදරවත්ත හෙවත් කලුවානේගෙදර වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. සේනාරත්න විසින් සාදන ලද 2015.07.02 දිනැති අංක 576/D දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල පර්චස් තිස්හතරයි දශම හතරයි පහක (අ. 0, රූ, 0, පර්. 34.45) හෙවත් හෙක්ටයාර 0.0871ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය උතුරට : අංක 576 දරන පිඹුරෙහි ලොට් 1B ද, නැගෙනහිරට : මහනුවර මාතලේ පාර ද, බලයලත් මිනින්දෝරු එන්. සේනාරත්න විසින් සාදන ලද අංක 576/B දරන පිඹුරෙහි ලොට් 1 හා 2 ද, දකුණට : බලයලත් මිනින්දෝරු එන්. සේනාරත්න විසින් සාදන ලද අංක 576/B දරන පිඹුරෙහි ලොට් 1 හා 2 වඩා නිවැරදිව බලයලත් මිනින්දෝරු එන්. සේනාරත්න විසින් සාදන ලද අංක 576/B දරන පිඹුරෙහි ලොට් 1 හා 2 සහ හරස්ගම ගෙදරවත්ත ද, බස්නාහිරට : උඩහ හරස්ගම ගෙදරවත්ත ද මායිම්ව එහි ඇති පස, ගහකොළ සහ සියලු දේ ද සමග වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ R 51/47 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. කේ. ගජනායක,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

07-714

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කිලිනොච්චි උතුරු ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභා සීමාව තුළ එම්යූ 50 විසුවමඩු ග්‍රාම නිලධාරි වසම විසුවමඩුවහි පිහිටි විසුවමඩු කොටස 1 නමැති ඉඩමට බලයලත් මානක ඒ. සී.එම් රාෆික් විසින් 2013.09.16 වැනි දින සාදන ලද අංක 5336එම් දරන පිඹුරේ නිරූපිත ලොට් 01 සහ ලොට් 02 නමැති බෙදූ වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : අක්කර 01

මෙම දේපළ ධර්මලිංගම් දයාසීලන් සහ ධර්මලිංගම් දයානන්දන් යන අය බන්ධනදායින් වශනේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා

ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දේපලට පිවිසීම. - කිලිනොච්චි නගරයේ සිට යාපනය පාරේ පරන්තන් හන්දිය දක්වා ගමන් ගෙන පරන්තන් මුලතිව් පාරට පිවිස එම පාරේ කි. මී. 17.50ක් පමණ විස්වමඩු නගරය දක්වා පැමිණ දකුණට පිහිටි විස්වමඩු කුල පාරට පිවිස එම පාරේ මීටර් 150ක් පමණ ගිය පසු විස්වමඩු 1 වන හරස් වීදිය හමුවේ. මෙම හරස් පාර් දකුණු පසින් අදළ දේපල පිහිටා ඇත.

2019ක් වූ අගෝස්තු මස 15 වැනි දින ප. ව. 3.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.09.07 දින රජයේ ගැසට් පත්‍රය ද, 2018.09.25 දින ''ලක්බිම'', ''ඩේලිමිරර්'' හා ''තිනකුරල්'' පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක 011- 2661835, 011- 2661836, 011- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකතන අංක : 081-2210595/071-8446374/071- 4962449.

07-667

---

HNB 325 - 19

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - තංගල්ල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද, 2016.05.09 වැනි දින සහතික කළ අංක 15455, දරන බැඳුම්කර යටතේ අය විය යුතු මුදල් ගෙවීම හේවා යද්දෙහිගේ ශානිකා අනුරාධි සහ වීරසිංහ මුහන්දිරම්ගේ ශිරෝමන් ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 21 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ.- දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ වීරකැටිය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත බුද්දියාගම ග්‍රාම නිලධාරි වසමේ බුද්දියාගම පිහිටි ඇත්මගේවත්ත හෙවත් වැලිකඩේ මුදලාලිගේ ඇත්මගේවත්ත හෙවත් පරන්දලාවේහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පී. පී. ජයවර්ධන විසින් 2006.02.24 වැනි දින පිළියෙල කරන ලද අංක 4248 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 01 ලෙස දක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස්පහ (අ. 0, රූ. 1, පර්. 35) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි වගාවන් සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මෑතකදී කරන ලද මිනුම් සැලැස්මේ ඉහත ඉඩම පහත පරිදි විස්තර කර ඇත.

ඉහත කී බුද්දියාගම පිහිටි ඇක්මගේවත්ත හෙවත් වැලිකඩේ මුලානේ ඇක්මගේවත්ත හෙවත් පරන්දලාවේහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. වී. පී. එස්. පණ්ඩිතසේකර විසින් 2011.06.02 වැනි දින පිළියෙල කරන ලද අංක 110601 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 01 ලෙස දක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස්පහ (අ. 0, රූ. 1, පර්. 35) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි වගාවන් සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.5.31 දින රජයේ ගැසට් පත්‍රය හා 2019.06.12 වැනි දින ''මව්බිම'', ''තිනක්කුරල්'' සහ ''ඩේලිමිරර්'' පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසිම.- වීරකැටිය හන්දියේ සිට තංගල්ල පාරේ මීටර් 150ක් පමණ ගමන් කරන්න. එම පාරේ දකුණු අත පැත්තේ දේපළ පිහිටා ඇත. වීරකැටිය තංගල්ල පාරේ මෝටර් රථයකින් යා හැකි ප්‍රවේශයක් එයට ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් දාහක් ද (රු. 1,000) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු.- (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සි. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකතන අංක 2661866, 2661828) ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනට ම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56, මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකථන අංක 0777-378441/0714-424478
ෆැක්ස් අංකය : 0112 - 509442.

07-664

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.- විදේශීය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පී.කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

ශ්‍රී ලංකා ජනරජයේ, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15 හි පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන ණයකරුගේ කුමන හෝ සියලුම චංචල ව්‍යාපාර වත්කම් සහ ආශ්‍රිත උපකරණ සහ ණයකරු දැනට සිටින හෝ මින්මතු ඕනෑම අවස්ථාවක සහ කලින් කලට ව්‍යාපාර කරගෙන යා හැකි අනෙකුත් පරිශ්‍රයන් හි ඇති සහ තබා ඇති හෝ කලින් කලට සවිකරනු ලබන සහ ගබඩාකරනු ලබන එකී යන්ත්‍රෝපකරණ සහ එමෙන්ම මින් මතු ඕනෑම අවස්ථාවකදී සහ කලින් කලට තවදුරටත් පවත්වාගෙන යාම තුළදී එකී පරිශ්‍රයන් හෝ වෙනත් ස්ථාන මත ගබඩාකොට තබා තියන්නට ගෙන එනු ලබන යන්ත්‍රෝපකරණ සහ ණයකරු ඕනෑම අවස්ථාවක කරගෙන යාහැකි සහ ව්‍යාපාරය කරගෙන යන හෝ පහත දැක්වෙන දේට සීමා නොවූ නමුත් ඇතුළත් එකී චංචල යන්ත්‍රෝපකරණ සවි කරනු ලබන හෝ ගබඩා කර තබනු ලබන හෝ වෙළඳාම් කරන හෝ වෙනත් ඕනෑම පරිශ්‍රයක හෝ එකී පරිශ්‍රයන් හි ඇති වෙනත් ස්ථානයන්ට ගෙන යෑමට අල්පකාලීනව තබා ඇති සියල්ල මුළුමනින්ම වේ.

| විස්තරය | ප්‍රමාණය | කාණ්ඩ අංකය |
|---|---|---|
| Tug Boats | 2 | CWIP004/CWIP017 |
| Barge (42 meters) | 1 | CWIP012 |
| SLTS Equipment-WINCH ASSEMBLY - SLTS WCHWC04/WCHWC05/ WCHWC06/WCHWC07 | 8 | WCHWC 01/WCHWC02/WCHWC03/ WCHWC08 |
| SLTS Equipment-MRT DRIVE UNIT | 12 | PKG 1-12 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-WINCH POWER PACK - SLTS | 4 | PKG 20-23 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-MRT IDLE UNIT - SLTS | 4 | PKG 13-16 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-MRT CONTROL POWER PACK-SLTS | 2 | PKG 17-18 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-LOWER SHEAVE ASSEMBLY-SLTS | 8 | PKG 24-31(ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-CONTROL SYSTEM & ACCESSORIES-SLTS | 1 | PKG 57 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-BALANCE CYLINDER - SLTS | 32 | PKG 40 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-LINK BEAM - SLTS | 12 | PKG 19 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-WIRE DRUM - SLTS | 16 | PKG 41-56 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-SPARE PARTS - SLTS | 1 | PKG 58-59 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-LOCKING BARS - SLTS | 8 | PKG 32-39 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| SLTS Equipment-INSTALLATION PARTS - SLTS | 1 | PKG 09 (ඇසුරුම විවෘත කළ පසුව පමණක් කාණ්ඩය දිය හැක) |
| Kbelco RK 350-2 Mobile Crane | 1 | EZ-08-09031 |
| HP Air Compressor | 1 | CZG 17091640 |
| Diesel Engine Driven Air Compressor | 1 | CZ0 17091640 |
| Bob Cat Telehandler | 1 | AC - 1915661 |
| Fork Lift 5 Ton | 1 | 8FD50N - 11941 |
| Winch 20 Ton | 1 | 200KN170589 |
| CNC Gas Cutting Machine | 1 | S-N0216051356 |
| Air Compressor | 2 | DTE - 072080/78458199 |
| Fire Pump | 1 | FP - 000612 |
| Welding Plant (Inver Mig 500) | 9 | 160724300088/89/90/91/92/93/94/95/96 |
| Power Generator 110 KVA/88KW | 1 | RJ 51175*R016586 |
| Plasma Cutting Machine | 2 | 22790915/22790815 |
| Mig Welding Machine Inver MIG 500 025 | 7 | 160724300097/98/99/100/110/111/17114400 |
| TIG Welding Machine CC 400A | 7 | 16032730314/17/18/15/16/19/20 |
| Welding Plant (Arc) 3 Phase | 10 | Z1141101073/21/25/23/24/56/68/69/92/99 |
| Submerge Arc Welding/Mig/Gauging plant (Submerge) | 3 | 16032830004/5/6 |
| Welding Plant (DC/400A) (Inverdelta 400 Hugong-Ch 89 | 11 | 161024300052/51/98/97/96/95/94/93/91/90/ |
| TIG Welding Machine Optimarc 500 | 3 | 17052430075/73/72 |
| High Pressure Washine Machine | 1 | 1000815845 |
| Sand Blasting Unit | 2 | PMSBPL000001/PMSBPL000002 |
| MIG Welding Plant DC 400A | 6 | 16032730310/08/07/05/03/02 |
| Yard Vehicles JHDFJIJMPFXX12324/01503k410034 92430359/ 1508243058/ | 3 | LM0619-LETAFAG25FHN70956/ LM2890- (DT15AK) 15092430360/15092430352/150 |
| Welding Plant - MIG | 6 | 16102430005/161223300011 |
| Insulation Testor | 1 | E8139733 |
| TIG Welding Machine AC/DC Super Wave CC 400 | 3 | PMWDPL000023/PMWDPL000024/ PMWDPL000025 |
| TIG Welding Machine Linear 530 | 2 | 19959 501534/484575/501541/5011567/501542/50 1539 484574/ |
| Rotary Hammer - TE 2-M | 10 | 484578/484582/438611 |
| Tig Welding Plant | 2 | PMWDPL000062/PMWDPL000063 |
| TIG Welding Machine Invermig 350 | 3 | 15092330011/15092430358/15092430354 |
| Air less spray painting machine | 1 | UCTRA-695-MAX-11 |
| IK-12 Beetle Track Cutter with 2 Tracks and Circle 5170023 | 6 | 517007/517008/5170010/5170014/5170015/ |
| Beetle Track Cutter 035 | 6 | 216013/216019/216023/216029/216030/216 |
| Gas Ditector | 1 | 152S12131 |
| 1K-12 Beetle Track Cutter 051 | 6 | 616004/616009/616014/616041/616049/616 |
| TIG Welding Machine AC/DC Super Wave 4001 Water Co | 2 | PMWDPL000015 |
| Track Cutters (upto 50mm) 19/ | 6 | 0216024/1114019/1114005/11114016/08146 0216016 |

ශ්‍රී ලංකාවේ නීති යටතේ සංස්ථාපිත නීත්‍යානුකූල සමාගමක් වන අංක 18, ශාන්ත මයිකල් පාර, කොළඹ 03 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති වෝකර්ස් කලම්බු ෂිප්යාඩ් (පුද්ගලික) සමාගම ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් යන්ත්‍රෝපකරණ වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 07 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.02.15 දින රජයේ ගැසට් පත්‍රය, මව්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2019.07.19 වැනි දින දිවයින, ඩේලිනිව්ස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම. - කොළඹ 13, හෙට්ටියාවත්ත හංදියේ සිට ඉදිරියට ගමන් කර ශ්‍රීමත් රාමනාදන් මාවත ඔස්සේ මීටර් 700 පමණ ගොස් වම් පැත්තට ඇති ශාන්ත ඇනඩෲ මාවත ඔස්සේ පැමිණ, රොක් හවුස් යුද හමුදා කඳවුර පසුකර වම්පසට ඇති ද ලා සාල් වීදියට පැමිණ, ද ලා සාල් විද්‍යාලය පසු කළ පසු, දකුණු පැත්තට ඇති රොක් හවුස් පටුමග අවසානයේ මෙම උපකරණ පිහිටි ස්ථානයට ලඟා විය හැක.

ගෙවීමේ ක්‍රමය. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම්කරු විසින් එදින සම්පූර්ණ මුදල් ගෙවා යන්ත්‍රෝපකරණ ඉවත් කරගත යුතුයි,
02. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
03. නොතාරිස් ගාස්තුව රු. 2,000
04. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
05. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්.

වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකතන අංක 011- 2445393/011-2396520
ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice84@gmail.com

ජ්‍යෙෂ්ඨ කළමණාකරු,
මධ්‍යම ණය අයකර ගැනීමේ අංශය,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 21, සර් රසික් ෆරීඩ් මාවත,
කොළඹ 01.
දුරකථන අංක : 011 - 2486000.

07-582

---

**ඩී. එෆ්. සී. සී. බැන්ක් පී. එල්. සී. ප්‍රසිද්ධ වෙන්දේසියක්**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

**බදුල්ල, අලුගොල්ල පාරේ වරිපනම් අංක 63/153 දරන පරිශ්‍රයේ පිහිටි රූඩ් 1 පර්චස් 03 විශාලැති අගනා දේපලක්**

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, රිලාපොළ කෝරලේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බදුල්ල මහ නගර සභා සීමාවේ බදුල්ල - බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිටවෙළගම ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එම්. අනුර කමල්සිරි විසින් 2004 ජූලි මස 12 වන දින මැන සකස් කරන ලද අංක 106/2014 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන ''මැදහේන පතන''නමැති ඉඩම.

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. හෙන්නායක මැණිකේ විසින් සහතික කරන ලද්දාවූද DFCC Bank PLC (Successor to DFCC Vardhana Bank PLC.) නමට ලියන ලද්දාවූද 2014 දෙසැම්බර් මස 29 වන දින සහතික කරන ලද අංක 5436 ද, 2015 මැයි මස 26 වන දින සහතික කරන ලද අංක. 5580 ද, 2016 දෙසැම්බර් මස 23 දින සහතික කරන ලද අංක 6192 ද, 2017 ජුනි මස 22 දින සහතික කරන ලද අංක 6338 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල ගෙවීමට දිසානායක මුදියන්සේලාගේ ජයවික්‍රම ජයවීර බණ්ඩාර ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපල 2019 ක් වූ අගෝස්තු මස 30 වන දින පෙ.ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2019.05.24 දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයද, 2019.05.13 වන දින දි අයිලන්ඩ් ''දිවයින''සහ තිනක්කුරල් යන පුවත් පත් බලන්න.

දේපළට ප්‍රවිෂ්ඨ වන මාර්ගය.- බදුල්ල නගරයේ සිට බණ්ඩාරවෙල මාර්ගය ඔස්සේ කි මී. 1.3 ගමන් කර දකුණට හැරී අළුගොල්ල පාරේ කි. මී. 2 ක් පමණ ගමන්කිරීමෙන් එම පාරට මුහුණලා පාරේ වම් පසින් මෙම දේපල පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය. (1) ගැණුම් මුදලින් 10% ක් ද (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බදුද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද (5) ලිපිකරු සහ සොෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවතේ අංක 73, ඩීඑෆ්සීසී බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමණාකාරිනී, ණය පුනරුත්තාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 011-2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන 2873656, 0777-672082 ෆැක්ස් 2871184

07-563

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කිලිනොච්චි දකුණ ශාඛාව**

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

යාපනය ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සිවරාමසර්මා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ ද 2016.09.19 වන දින සහතික කරන ලද අංක 1243 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වඩිවෙල් ජෙරාල් ක්‍රිෂාන්ත සහ කඳන ආරච්චිගේ දෝන රංගා සුදර්ශනී ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල් සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපල, හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2019 අගෝස්තු මස 16 වන දින පෙ.ව. 11.30 දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැළණිය ප්‍රාදේශීය සභාවේ බල සීමාව ඇතුළත වසම් අංක 04 තුළ කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලවතුහේන්පිටිය බටහිර (261) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වරහන්තුඩුව ගමේ හි පිහිටි නුවර පාරේ වරිපනම් අංක 477/21/E දරන දෙල්ගහවත්ත නමැති ඉඩම (බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් 2007 පෙබරවාරි 26 වන දින පිළියෙල කරන ලද අංක 10549 දරන පිඹුරේ දැක්වෙන ලොට් ඩී 1 හි නැවත මැනීමක් සහ උප බෙදුමක් වන) බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් 2016 මාර්තු 2 වන දින පිළියෙල කරන ලද අංක 11538 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 6 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් හයක් වූ (අ. 0, රූ, 0,පර්. 6) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුලුව මාර්ග අයිතිය ද වේ.

වැඩි විස්තර සඳහා : 2019.05.31 වන දින රජයේ ගැසට් පත්‍රයේ ද 2019.06.06 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපලට පිවිසෙන මාර්ගය.- නුවර පාර දිගේ කොළඹ කොටුවේ සිට මහර දෙසට ගොස් කිරිබත්ගොඩ පසුකොට වමට හැරි ගුණවර්ධන මාවත දිගේ ගොස් ජුකි මැෂින් තිබෙන ස්ථානයට යන්න. ඉන්පසු පටු කොන්ක්‍රීට් පාර කෙළවර මීටර් 400 ක් පමණ යන්න. දේපල පිහිටා තිබෙන්නේ සංවර්ධිත දේපල තුළ දකුණු අත පැත්තේ පලමුවන දේපල ලෙසය.

ගෙවීමේ ක්‍රමය.-

1. ගැනුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කල යුතුයි. ප්‍රධාන කළමණාකරු (අය කිරීම්) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479 ටී. බී. ජයාමාවත, කොළඹ 10, ලිපිනය වෙත ගෙවිය යුතුය.

දුරකථන : 011-2661866 011-2661828
හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාමවිනිසුරු (මුළු දිවයිනටම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන 011 - 2053286/072-3207533
076-9217329/072-0881044

07-697

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වෙන්නප්පුව ශාඛාව**

අංක 1990 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මීගමුවේ ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් 2005.04.01 වන දින සහතික කරන ලද අංක 1159, 2006.04.21 වන දින සහතික කරන ලද අංක 1510, 2008.03.17 වන දින සහතික කරන ලද අංක 2361, 2010.02.17 වන දින සහතික කරන ලද අංක 2946 සහ 2011.05.25 වන දින සහතික කරන ලද අංක 3440 සහ වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා විසින් 2015.01.12 වන දින සහතික කරන ලද අංක 38015, 2016.03.03 වන දින සහතික කර ලද අංක 38901, 2017.04.27 වන දින සහතික කරන ලද අංක 39801 සහ 2018.06.15 වන දින සහතික කරන ලද අංක 40485 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කෙහෙල් බද්දරගේ ස්ටැන්ලි සේනාරත්න ප්‍රනාන්දු ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් සහ වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපල හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2019 අගෝස්තු මස 15 වන දින පෙ.ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ පිටිගල් කෝරලේ යටකලන් පත්තුවේ පහළ මහවැව ග්‍රාම සේවක කොට්ඨාසය ඇතුලත මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇතුලත නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමා ඇතුලත පහළ මහවැව පිහිටි කජුගහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී. ඩබ්. ප්‍රනාන්දු විසින් 2005.02.16 වන දින පිළියෙල කරන ලද අංක 2948 දරන පිඹුරේ බෙද වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් පහයි දශම දෙකයි බිංදුවක් වූ (අ. 0, රූ. 1 පර්. 5.20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුලට සියලු දේද වේ.

වැඩි විස්තරසඳහා : 2019.05.31 වන දින රජයේ ගැසට් පත්‍රයේ ද 2019.06.11 මව්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

දේපලට පිවිසෙන මාර්ගය.- කොළඹ නගර සීමාවේ සිට මීගමුව හලාවත පාර දිගේ කි. මී. 59.5 පමණ ගොස් මහවැව බසාර් එකෙන් වමට තොඩුවැව පාරට හැරී මීටර් 200 ක් පමණ ගියවිට දී පාරට මුහුණලා මෙම දේපල දකුණු පැත්තේ පිහිටා ඇත. (ල.වි. ම. ට්‍රාන්ස්ෆෝමර් එකට කලින්) පාර දෙපැත්තේම මාරවිල සහ මාඩම්පේ නගරවලට දුර කිලෝමීටර් 5 පමණි.

ගෙවීමේ ක්‍රමය.-

1. ගැනුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1000 ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින 30 ක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමණාකාරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පීඑල්සී අංක 479 ටි. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතුය.

දුරකථන : 011-2661866, 011-2661828
හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාමවිනිසුරු (මුළු දිවයිනටම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ,
දුරකථන : 011-2053286/072-3207533
076-9217329/072-0881044

07-696

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ එකී දේපල පිහිටි ස්ථානයන්හිදී පහත දැක්වෙන වේලාවන් හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(1) උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ, වලිගාමම් නැගෙනහිර කොට්ඨාසයේ, කෝපායි ප්‍රදේශයේ වලිගාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභා සීමාවේ කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, J264 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුල රූම්පිරායිහි පිහිටි ''අම්බිකායි පුලම්'' නමැති බලයලත් මිනින්දෝරු එස්. කේ. සිවනන්දන් විසින් සම්පාදිත 2012.11.02 දිනැති අංක 2756 දරන මිනුම්දෝරු සැලැස්මේ ලොට් 1 යනුවෙන් නිරූපනය වන ඉඩම සහ එහි පිහිටි නිවස, ළිඳ සහ ඊට අයත් අනිකුත් සියලු අංගෝපාංගයන් ද වේ.

විශාලත්වය - ලාවම් 1 සහ කුලි 12.68

ඉහත කී දේපලට පිවිසෙන මාර්ගය.- යාපනය නගර මධ්‍යයේ සිට පළාලි ප්‍රධාන මාර්ගය ඔස්සේ කිලෝමීටර 6 ක් පමණ උරුම්පිරායි නගර හන්දිය දක්වා පැමිණ මීටර 75 ක් පමණ ගමන් කර කිලෝමීටර 6 කණුව පසුකර වමට හැරී මනිප්පායි ප්‍රධාන මාර්ගය ඔස්සේ තවත් මීටර් 350-400 පමණ පැමිණි පසු වාකයියඩි හන්දිය නමැති කුඩා හන්දිය හමු වේ. එතැන් සිට දකුණු දෙසට ඇති වාකයියඩි පාරේ තවත් මීටර් 50-60 ක් පමණ දුර ගිය විට පාරේ වම් පසින් විෂය ගත දේපල හමු වේ.

වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 15 වන දින පෙරවරු 9.30 ට
(2) උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ සහ යාපනය කොට්ඨාසයේ, නල්ලූර් ප්‍රදේශයේ, කොකුවිල් බටහිර පිහිටි ඉඩම වන නල්ලූර් ප්‍රාදේශීය සභා සීමාවේ නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල J124 ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් ''මුතලිපුලියාඩි සහ කොත්තිත්තිඩාල්'' නමැති බලයලත් මිනින්දෝරු ඒ. අරුල්නේසන් විසින් සම්පාදිත සහ 2013.05.01 දිනැති අංක 1314C දරන මිනින්දෝරු සැලැස්මේ ලොට් 1 යනුවෙන් දැක්වෙන ඉඩම ඇතුලු එහි පිහිටි සියලු දෙය වේ.

විශාලත්වය - ලාවම් 4 සහ කුලි 5

දේපලට පිවිසෙන මාර්ගය.- යාපනය නගර මධ්‍යයේ සිට කන්කසන්තුරේ ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර 4 1/4 ක් පමණ කොකුවිල් නගරයේ කුලප්පිඩි හන්දිය දක්වා පැමිණ මීටර 30 ක් පමණ පසු කල විට අංක 5/2 බෝක්කුව හමුවේ. එතැනින් වමට හැරී කුලප්පිඩි ආනයික්කොඩයි ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් 1/4 ක් පමණ ගිය විට කුඩා හන්දියක් හමු වේ. එතැන් සිට නඩරාසා පාර ලෙස හඳුන්වන දකුණු දෙසට ඇති බොරලු පාරේ තවත් මීටර 50-75 ක් පමණ ගිය විට දකුණු දෙසට කුඩා වංගුවක් ඇති අතර එම පටුමගේ වම් පසින් විෂය ගත දේපල පිහිටා ඇත.

වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 15 වන දින පෙරවරු 10.30 ට යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එස්. සිවපාතම් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.04.05 දිනැති අංක 8754 දරන ප්‍රාථමික චල උකස්කරය සහ 2018.04.05 දිනැති අංක 8756 දරන ප්‍රාථමික චල උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිවකුරු සිවකුමාර් සහ විජිකලා සිවකුමාර් යන අය බන්ධනදායීන්/උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදන සඳහා.- වර්ෂ 2019 ජුනි මස 28 වන දිනැති රජයේ ගැසට් පත්‍රයද, වර්ෂ 2019 ජුනි මස 21 වන දිනැති දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත් පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්)
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙක හමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු 5,000).

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු සඳහා කළමණාකරු ණය අයකර ගැනීම් අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන 011-4667218/011-4667230.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු,

අංක 369/1, දුටුගැමුණු මාවත, මාවිල්මඩ, මහනුවර.
දුරකථන 071-8446374 0777-761706- ෆැක්ස් :081-12210595

07-670

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

මෙම දේපල (ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සීහි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රදීපා පී. වික්‍රමතිලක විසින් ලියා සහතික කරන ලද 2017.07.07 දිනැති අංක 2371 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම රාගම පදිංචි සුබසිංහ ආරච්චිගේ උපුල් පුෂ්පකුමාර සහ සුබසිංහ ආරච්චිගේ දනුෂ්කා හර්ෂ සුබසිංහ නොහොත් සුබසිංහ ආරච්චිගේ දනුෂ්කා හර්ෂන සුබසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹුව 181/G ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පහළ කරගහමුණ ගමේ පිහිටි ''පාලුවත්ත'' යනුවෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. පෙරේරා විසින් සාදන ලද 2014.04.08 දිනැති අංක 5283 දරන පිඹුරේ ලොට් A වශයෙන් දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම නවයයි එකක් (අ. 0, රූ. 0, පර්. 20.91) විශාල වූ ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ. වැව්ලි

ඇතුලු සියලු දේ වේ.

ඉහත සඳහන් දේපල 2019 අගෝස්තු මස 16 වැනි දින පෙරවරු 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම.- කඩවත සිට රාගම පාර ඔස්සේ කි. මී. 3.3 ක පමණ දුරක් ගොස් දෙල්ගොඩ හංදිය දක්වා පැමිණ දකුණු පසට ඇති මහර හිරගෙදර පාරට හැරී තවත් මීටර් 600 ක පමණ දුරක් ගිය විට අදාළ දේපල මහර හිරගෙදරට යන මාර්ගයේ හංදියේ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2019.05.24 වැනි දින පළ වී ඇති අතර දිවයින, ද අයිලන්ඩ් යන පුවත්පත්වල 2019.05.13 වැනි දිනද තිනකුරල් පුවත්පතේ 2019.05.14 දින ද පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකයි) වන පළාත් අධිකාරි බද්ද (VAT) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා (රුපියල් 3000) 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1,500 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, හෝ අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නීති අංශය, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02, දුරකථනය :011-2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකතන අංක : 011-3068185, 011-2572940.

07-628

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපල බොරලැස්ගමුව සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක පී. වී. 6751 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන අබේවර්ධන ඩිස්ට්‍රිබියුටර්ස් (පීවීටී) ලිමිටඩ් සහ කෝට්ටේ පදිංචි නිමල් අබේවර්ධන යන බන්ධනදායීන්/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

1 වන වෙන්දේසිය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුවාවල උතුර 578 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කටුවාවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් සාදන ලද 2002.07.30 දිනැති අංක 6198 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් 7 සහ 2001.01.16 වැනි දිනැති අංක 5973 දරන සැලැස්මේ නිරූපණය වන ලොට් ඒ1 හි එකතු කිරීමක් වන බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ විසින් සාදන ලද 2003.06.04 දිනැති අංක 6198/ඒ සැලැස්මේ නිරූපණය වන මහදෙනිය සහ කටුවාවලදෙනිය නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ (බලයලත් මිනින්දෝරු අයි. ටී. මාදෙල විසින් සාදන ලද 1998.08.16 දිනැති අංක 98/39 සඳහන් ලොට් 7 ට අනන්‍ය අංක 6198 සැලැස්මේ සඳහන් ලොට් 7) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 6198/ඒ දරන සැලැස්ම අනුව පර්චස් විසිපහයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 25.1) නොහොත් හෙක්ටයාර 0.0635 විශාල ඉඩම.

පහත සඳහන් ඉඩම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ බොරලැස්ගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුවාවල උතුර 578 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කටුවාවල ගමේ පිහිටි අංක 3176 දරන සැලැස්මේ නිරූපනය වන මහදෙණිය නමැති ඉඩමේ ලොට් 14 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3176 සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල 2019 අගෝස්තු මස 2 වැනි දින පස්වරු 3.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.
දේපලට පිවිසීම.- කොළඹ කොටුවේ සිට හොරණ පාර ඔස්සේ බොරලැස්ගමුව මංසන්ධිය දක්වා පැමිණ තවත් ඉදිරියට ගොස් ජනතා මාවත දක්වා පැමිණ ජනතා මාවත ඉදිරිපසින් වම්පසට ඇති අඩි 13 ක් පළල පුද්ගලික පාරට හැරෙන්න. එම මාර්ගයේ මඳ දුරක් ගිය විට අදාළ දේපල පිහිටා ඇත.

2 වන වෙන්දේසිය .-

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ, පොලොම්මරුව පිහිටි බලයලත් මිනින්දෝරු හේමසිරි සිරිබද්දන විසින් සාදන ලද 2006.12.20 දිනැති අංක 3365 දරන සැලැස්මේ නිරූපණය වන පැණිකොළහේනවත්ත නමැති සහ හඳුන්වනු ලබන ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3365 දරන සැලැස්ම අනුව අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසි පහයි දශම එකක් (අ. 1, රූ. 1, පර්. 25.1) විශාල ඉඩම.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුව පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ පොලොම්මරුව පිහිටි බලයලත් මිනින්දෝරු හේමසිරි සිරිබද්දන විසින් සාදන ලද 2006.12.20 දිනැති අංක 3365 දරන සැලැස්මේ නිරූපණය වන පැණිකොළහේනවත්ත නමැති සහ හඳුන්වනු ලබන ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 3365 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් විස්සක් (අ.0, රූ. 1,පර්. 20) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල 2019 අගෝස්තු මස 2 වැනි දින පෙරවරු 9.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම.- බෙලිඅත්ත නගරයේ සිට තංගල්ල පාර ඔස්සේ කි.මී. 5.3 පමණ දුරක් ගොස් නලගම මංසන්ධිය දක්වා පැමිණි විට බුදු පිළිමයක් තබා ඇති ස්ථානය අදාළ දේපල වේ. තංගල්ල නගරයේ සිට පැමිණෙන විට කි. මී. 2.1 ක දුරක් ගිය විට අදාළ දේපල හමුවේ.

3 වන වෙන්දේසිය.-

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර මහා නගර සභා සීමාව තුළ මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ එළියකන්ද දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පල්ලිමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු හෙන්රි අබේසිංහ විසින් සාදන ලද 2012.09.02 දිනැති අංක 82/2012 සැලැස්මේ නිරූපනය වන බීච් රෝඩ් වරිපනම් අංක 5 දරන පල්ලිමුල්ල තෝට්ටම් හෙවත් පල්ලිමුල්ල වත්ත හෙවත් ලෙබ්බෙගේවත්ත නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් නවයක් (අ. 0, රූ. 1, පර්. 9) ක් විශාල බිම, ගස්, වගා ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. පහත සඳහන් ඉඩම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ඉහත සඳහන් දේපල 2019 අගෝස්තු මස 2 වැනි දින පස්වරු 11.45 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපලට පිවිසීම.- මාතර ප්‍රධාන බස් නැවතුම් පොළේ සිට වෙරළ පාරට පිවිස වම්පසට හැරී වෙරළ පාර ඔස්සේ කි. මි. 1 වන කණුව දක්වා යන විට 1 වන කි. මී. කණුවට මීටර් කිහිපයකට පෙර අදළ දේපළ වෙරළ පාරේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2018.06.22 දින පළ වී ඇති අතර,දිවයින සහ ද අයිලන්ඩ් පුවත්පත්වල 2018.06.14 වන දින ද තිනකුරල් පුවත්පතේ 2018.06.14 වන දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර කොළඹ 03, දු. ක. 011-2456491, 2456481

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දු.ක. 011-3068185, 011-2572940

07-629

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - වෙන්නප්පුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, පෙතියාගොඩ ග්‍රාම නිලධාරි වසමේ සහ කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පෙතියාගොඩ පිහිටි ''අඹගහවත්ත හෙවත් කොස්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. එම්. ප්‍රනාන්දු විසින් 2008 මාර්තු 01 වැනි දින පිළියෙල කරන ලද අංක 241/2008 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1A1 දරන ප්‍රමාණය පර්චස් තිස් නවයක් (අ. 0, රූ,0 , පර්. 39) හෙවත් හෙක්ටයාර් 0.0986 විශාල ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 267/ඒ, කිරිබත්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල තලවතුහේන්පිට (උතුර) පිහිටි නුවර පාරේ වරිපනම් අංක 001/5, 015, 015/01/2017 දරන ''ගොරකාගහවත්ත හෙවත් මදුගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. එම්. ප්‍රනාන්දු විසින් 2013.10.11 වන දින පිළියෙල කරන ලද අංක 1135/2013 දරන පිඹුරේ දැක්වෙන ලොට් Q දරන ප්‍රමාණය රූඩ් එකයි පර්චස් හතරයි දශම තුනයි (අ. 0, රූ. 1. පර් 4.30) විශාල ඉඩම සමඟ ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් දේපල සුනන්ද ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ ලත්තුව හැන්දි හරිදු දර්ශන ද සිල්වා එසේම ලත්තුව හැන්දි හරිදු දර්ශන, ලත්තුව හැන්දි ගයාන් හර්ෂන ලෙස හඳුනාගත් එසේම ලත්තුව හැන්දි ගයාන් හර්ෂන සිල්වා, ලත්තුව හැන්දි සමාධි ශෂිකලා ද සිල්වා, ලත්තුව හැන්දි ලෂිනි හංසිකා සහ මල්ලෑහැ විදානරාළලාගේ කුමුදුනි ස්වර්ණලතා උකස්කරුවන් ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කර ඇත.

මෙහි දෙවන උපලේඛනයේ සඳහන් දේපල සුනන්ද ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ ලත්තුව හැන්දි හරිදු දර්ශන දි සිල්වා එසේ ම ලත්තුව හැන්දි හරිදු දර්ශන උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කර ඇත.

2 වන උපලේඛනය (අ. 0, රූ. 1, පර්. 4.30) වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 06 වැනි දින පෙ.ව. 9.30 ටද 1 වන උපලේඛනය (අ. 0, රූ, 0, පර්. 39) වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 06 වැනි දින පෙ.ව. 10.30 ට ද ඉහත ස්ථානවලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.07.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයද, දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2019.07.19 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද දිවයින, ඩේලි නිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම.-

පළමු වන උපලේඛනය

කිරිබත්ගොඩ නගර මධ්‍යයේ සිට කොළඹ- නුවර ප්‍රධාන පාර දිගේ කිලෝමීටර් 5.50 ක් පමණ ගමන් කර හතරවන හැතැප්ම කණුව දක්වා පැමිණ එතැනින් බියගම පාරට වමට හැරී කිලෝමීටර් 1.4 ක් පමණ ගමන් කළ විට වම් අත පැත්තේ තිබෙන අදාල දේපල වෙත ළඟා විය හැක.

දෙවන උපලේඛනය.-

පැලියගොඩ සීඝ්‍රගාමී මාර්ග පිවිසුමේ සිට කොළඹ - නුවර ප්‍රධාන පාර දිගේ නුවර (A1) දෙසට ගමන් කර කිරිබත්ගොඩ දෙවන කලර් ලයිට් හංදිය දක්වා කිලෝමීටර් 5.7 ක් පමණ ගමන් කළ විට වම් අත පැත්තේ අදාළ දේපල වෙත ළඟා විය හැක. (සුනන්ද ටෙක්ස්ටයිල්ස් ලෙස)

ගෙවීමේ ක්‍රමය.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

01. නිශ්චල දේපළ සඳහා ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. චංචල දේපළ සඳහා ගැණුම්කරු විසින් එදින සම්පූර්ණ මුදල ගෙවා භාණ්ඩ ඉවත් කර ගත යුතුයි,
03. නිශ්චල දේපළ සඳහා පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
05. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු,
06. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1500,
07. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
08. ගැණුම්කරු විසින් එකතු කල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි,
09. ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ වෙන්නප්පුව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙ න් විමසන්න.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.,
අංක 264, කොළඹ පාර,
වෙන්නප්පුව,
දුරකථන 031-2253445/031-2255552-3
ෆැක්ස් 031-2255551

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකථන 011-2445393 /0112396520
ෆැක්ස් 011-2445393
ඊමේල් :senaservice84@gamial .com.

07-583

---

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

1 වන කොටස - දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට වළල්ලාවිට කෝරළයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 25G දරන මධ්‍යම ඇල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ ගනේගෙ ාඩ ගමේ පිහිටි ''මගුරුවෙලගොඩැල්ල'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. කේ. ජී. ඔකඳපොල විසින් මැන සාදන ලද අංක 1963/2016 සහ 2016/12/24 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ ලොට් 3A දරන බිම් කොටස ප්‍රමාණය අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් සමගයි.

II වන කොටස.- දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වළල්ලාවිට කෝරළයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 26D දරන දකුණු අගල ග්‍රාම නිලධාරී වසමේ කුඩාගල ගමේ පිහිටි ''අම්බලමගාවා වත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. කේ. ජී. ඔකඳපොල විසින් මැන සාදන ලද අංක 1692/2016 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ ලොට් 1A දරන බිම් කොටස ප්‍රමාණය පර්චස් තිස්හයකුත් දශම හතරයි තුනක් (අ. 0, රූ. 0, පර්. 36.43) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් සමගය.

තව ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැලි වල වර්තමානයේ තිබෙන හෝ මෙහි මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇඳනු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන්ම උපකරණ, විදුලි සැපයුම් පද්ධති, උපකරණ, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමග යි.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. අනුරාධා විසින් සහතික කරන ලද අංක 402 සහ 2018.05.24 දින දරන උකස් බැඳුම්කරය මගින් ඉහත කී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස්කොට ඇපයට තබන ලද මෙහි ඉහත උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය එලෙස ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් ගෙවා පියවා දැමීම, ලියාපදිංචි අංක 1/4/155/2017 යටතේ '' Hansagiri EzRydz''නාමය, විලාසය සහ අභිධානය යටතේ ඇල්පිටියේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන ඇල්පිටියේ පදිංචි හේනගේ දොන් නිමේෂ් සඹින්ත (ණය ගැණුම්කරු) විසින් පැහැරහැරීම කර ඇති බැවින් ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන දේපල සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිය දරන්නා වන ඉහත කී හේනගේ දොන් නිමේෂ් සඹින්ත විසින් සිය සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී උකස් බැඳුම්කර යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් දේපළ I වන කොටස - 2019 ක් වූ අගෝස්තු මස 09 වැනි දින ප.ව. 2.30 ටත් II වන කොටස - 2019 ක් වූ අගෝස්තු මස 09 වැනි දින ප.ව. 3.30 ටත් අදාළ දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*I* වන කොටස පිහිටි දේපළට පිවිසීම.- ඇල්පිටිය බස් නැවතුම් පොළේ සිට පිටිගල පාරේ කිලෝමීටර් 1.3 පැමිණ, එතැනින් වමට හැරී අවිත්තාව පාරේ මීටර් 900 ක් පමණ ගමන් කරන විට මෙම දේපළ දකුණු පැත්තේ පිහිටා ඇත.

*II* වන කොටස පිහිටි දේපළට පිවිසීම.- ඇල්පිටිය නගර මධ්‍යයේ සිට මතුගම පාරේ මීටර් 900ක් පමණ ගමන් කරන විට මෙම දේපළ වම් පැත්තේ පිහිටා ඇත. තවද, මීටර් 50 ක දුරින් ඉන්ධන පිරවුම් පළක් ද, පෙර පාසළ පසු කරනවාත්

සමඟම මෙම දේපළ පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය.- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුළත නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. හි තැන්පත් කළ යුතුය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සඳහා සියය එකයි (1%)
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
06. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1000
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,500

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න :
කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,
අංක 40, නවම් මාවත, කොළඹ 02,
දුරකථන අංක 011-2448448.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රෝෆ් වීදිය, කොළඹ 12
දුරකථන අංක : 077-3242954, 0112-445393.

07-577

---

### නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

#### උපලේඛනය

1 වන කොටස

01. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ යක්කලමුල්ලේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 179A දරන නාකියාදෙණිය ග්‍රාම නිලධාරි වසමේ තෙල්ලබුර ගමේ පිහිටි ''අකුලහේන'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. ආර්. ජයසුන්දර විසින් මැන සාදන ලද අංක 3009A සහ 2012.01.08 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 99E (අංක 304/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් 99 හි නැවත මැන බෙදීමක් වන) දරන බිම් කොටස ප්‍රමාණය අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩම් කැබැල්ල සහ එහි පස, තේ කම්හල, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමඟ ය.

*II* වන කොටස

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ යක්කලමුල්ලේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 179A දරන නාකියාදෙණිය ග්‍රාම නිලධාරී වසමේ තෙල්ලබුර ගමේ පිහිටි ''අකුලහේන'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. ආර්. ජයසුන්දර විසින් මැන සාදන ලද අංක 3009A සහ 2012.01.08 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ 2A (ලොට් 2 දරන බිම් කොටසේ අනුබෙදීමක් වන) දරන බිම් කොටස. ප්‍රමාණය අක්කර එකක් (අ.1, රූ. 0, පර්. 0) විශාල ඉඩම් කැබැල්ල,

තව ද, මෙහි ඉහත සවිස්තරව දක්වෙන ඉඩම් කැබැල්ලේ වර්තමානයේ තිබෙන හෝ මෙහි මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇඳනු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන් ම උපකරණ, විදුලි සැපයුම් පද්ධති උපකරණ, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමඟ ය.

''ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් බිමාලි කාමලිකා සූරියාරච්චි විසින් සහතික කරන ලද අංක 1341 සහ 2015.07.14 දින දරන උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් විසින් ම සහතික කරන ලද අංක 1494 සහ 2016.08.09 දින දරන උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් විසින් ම සහතික කරන ලද අංක 1344 සහ 2015.07.14 දින දරන උකස් බැඳුම්කරය මගින් ඉහත කී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස්කොට ඇපයට තබන ලද මෙහි පහත උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සවිස්තරව දක්වෙන දේපළ සහ පරිශ්‍රය එලෙස ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් ගෙවා පියවා දැමීම, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද, ගාල්ල, නාකියාදෙණිය යන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, එකී සම්රින් හෝල්ඩිංග් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV99326) (ණය ගැණුම්කරු) විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, මෙහි පහත උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සවිස්තරව දක්වෙන දේපල සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිය දරන්නා වන ඉහත කී සම්රින් හෝල්ඩිංග් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සිය සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 1341, 1494, සහ 1344 දරන උකස් බැඳුම්කර යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද, නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් දේපළ I වන කොටස - 2019 ක් වූ අගෝස්තු මස 09 වන දින පෙ.ව. 10.00ටත් II වන කොටස - 2019 ක් වූ අගෝස්තු මස 09 වන දින පෙ.ව. 10.30 ටත් අදාල දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- ගාල්ල මධ්‍යම බස් නැවතුම් පොළේ සිට ගාල්ල මාතර ප්‍රධාන පාරේ සම්බෝධිය හංදිය තෙක් උඩුගම පාර දක්වා කිලෝමීටර් 2.5 පැමිණ, එතැනින් වමට ඇති උඩුගම පාරට හැරී එතැන සිට කිලෝමීටර් 20 ක් පමණ ගමන් කර අකුල්හේනට පැමිණ දික්කුඹුර මංසන්ධිය වමට හැරී අකුල්හේන පාරේ කිලෝමීටර් 3 ක් ගමන් කර තවත් මීටර් 100 ක් සම්රින් ටී ෆැක්ටරි පාර දක්වා පැමිණ එතැනින් සම්රින් ටී ෆැක්ටරි පාරේ තවත් මීටර් 200 ක් ගමන් කරන විට මෙම දේපළට ළඟා විය හැක.

ගෙවීම් කළ යුතු ආකාරය.- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුලත නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. හි තැන්පත් කළ යුතුය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,500

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්නඃ

කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂන්ල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,
අංක 40, නවම් මාවත, කොළඹ 02,
දුරකථන අංක 011-2448448.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්වරු,

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රෝෆ් වීදිය. කොළඹ 12.
දුරකථන 077-3242954 0112-445393

07-578

---

### නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

#### ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 25 G දරන මධ්‍යම ඇල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ ඇල්පිටිය ගනේගොඩ, වලහේන, හංසගිරි නිවාස අංක 355A දරන පරිශ්‍රයෙහි තිබෙන, හෝ ගබඩාකර තිබෙන හෝ සවිකර තිබෙන හෝ බද්ධකර තිබෙන, එකී ව්‍යාපෘතිය සඳහා/සම්බන්ධයෙන් මිලදී ගතයුතු පිරියත යන්ත්‍රසූත්‍ර උපකරණ තිරවුරු සහ සවිකිරීම් යනාදිය වේ.

| *යන්ත්‍රය පිළිබඳ විස්තරය තත්ත්වය* | *නිෂ්පාදනය වර්ගය සහ මාදිලිය* | *නිෂ්පාදිත රට* | *නිෂ්පාදිත වර්ෂය* | *ඒකක සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| කනින යන්ත්‍ර (එක්ස්කැවේටර්) | කොමැට්සු. PC 350-10 | ජපානය | 2016 | 02 |
| කනින යන්ත්‍ර (එක්ස්කැවේටර්) | කොමැට්සු. PC 200-10 | ජපානය | 2016 | 01 |

''ප්‍රසිද්ධ නොතාරිස් එම්. අනුරාධා මධුභාෂිණි විසින් සහතික කරන ලද අංක 404 සහ 2018.05.24 දරන උකස් බැඳුම්කරය මගින් ඉහත කී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස්කොට ඇපයට තබන ලද මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වෙන චංචල පිරියත සහ යන්ත්‍රෝපකරණ එලෙස ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් ගෙවා පියවා දැමීම, ලියාපදිංචි අංක 1/4/155/2017 යටතේ "Hansagiri EzRydz" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ ඇල්පිටියේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන ඇල්පිටියේ පදිංචි හේනගේ දොන් නිමේෂ් සෂින්ත (ණය ගැණුම්කරු) විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද, මෙහි ඉහත සවිස්තරව දක්වෙන චංචල දේපලේ අයිතිය දරන්නා වන ඉහත කී හේනගේ දොන් නිමේෂ් සෂින්ත විසින් සිය සින්නක්කර අයිතිය සහ හිමිකම ඉහත කී අංක 404 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද, නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් දේපළ වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 09 වන දින ප.ව. 4.30 ට අදාල දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- ඇල්පිටිය බස් නැවතුම් පොළේ සිට පිටිගල පාරේ කිලෝමීටර් 1.3 පැමිණ එතැනින් වමට හැරී අවිත්තාව පාරේ මීටර් 900 ක් පමණ ගමන් කරන විට මෙම දේපළ දකුණු පැත්තේ පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය .- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට සියයක් (100%),
02. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
03. වෙන්දේසියේදී මිළදී ගන්නා සියළුම යන්ත්‍රෝපකරණ එවෙලෙම ඉවත් කර ගත යුතුයි,
04. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
05. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 1,500.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න :

කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.,
අංක 40, නවම් මාවත, කොළඹ 02
දුරකථන අංක 011-2448448

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,

බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය, කොළඹ 12
දුරකථන 077-3242954, 0112-445393.

07-576

---

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුදා දිනට පෙර දැනුම් දිය යුතුය.**

I කොටස : I ඡේදය යටතේ පළවන දැන්වීම් සහ I කොටස : (IIආ) ඡෙදයේ වෙන්දේසි කිරීම් යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2019.07.19 දින ගැසට් පත්‍රයේ පළවේ.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk